**සැ.යු.**: ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2026.06.12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,494 - 2026 ජුනි මස 19 සිකුරාදා - 2026.06.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 10 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 26 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82802 - (2026/06)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

### වෙළඳ නාවික ලේකම් කාර්යාලය

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) | 01 |
| 02. සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | 02 |
| 03. සහකාර නැව් ගමන් නිලධාරි | 01 |

**වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) සහ සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) තනතුරු සඳහා බඳවා ගැනීම - 2026**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) සහ සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) යන තනතුරු සඳහා මෙහි දෙවන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | 02 |
| 02. සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) | 01 |

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය :- 2026.07.20

(01) බඳවාගැනීමේ ක්‍රමය:

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන්, පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගනු ලැබේ. එහි දී යොදා ගනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

(02) අවශ්‍ය සුදුසුකම්:

(I) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :

| ***තනතුර*** | ***අධ්‍යාපන සුදුසුකම්*** | ***පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්*** |
|---|---|---|
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | සමුද්‍රීය ඉංජිනේරු මුරකාවල කාර්යභාර නිලධාරි (සීමා රහිත) සහතිකය ලබා තිබීම | කිලෝවොට් 300 ට වැඩි ධාරිතාවයක් ඇති සාගර තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක මුරකාවල කාර්යභාර ඉංජිනේරු නිලධාරියෙකු ලෙස වසර 02 ක අවම පළපුරුද්ද |

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) | ජලතරණ මුරකාවල කාර්යභාර නිලධාරි (සීමා රහිත) සහතිකය ලබා තිබීම | දළ ටොන් 3000 ට වැඩි ධාරිතාවයක් ඇති සාගර තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක මුරකාවල කාර්යභාර නැව් තට්ටු නිලධාරියෙකු ලෙස වසර 02 ක අවම පළපුරුද්ද |

(II) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(III) වයස් සීමාව :
අවුරුදු 21 ට නොඅඩු - අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

(IV) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

***සටහන:-*** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(03) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:

I. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තාවූද, මතුවට කරනු ලබන්නාවූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

II. අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

(04) වැටුප් පරිමාණය: MN 5-2025

රු. 58,660-10 X 1,190-11 X 1,360-15 X 1,670- රු.110,570

(05) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **01** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | **30** |
| | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව හෝ සාමුද්‍රික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා; | 30 | |
| | II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව හෝ සාමුද්‍රික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා; | 20 | |
| | III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව හෝ සාමුද්‍රික විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා | 15 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **02** | **වෘත්තීය සුදුසුකම්**<br><br>සමුද්‍රීය සෝදිසි කිරීම, සාමුද්‍රික නීතිය හා රෙගුලාසි, සාමුද්‍රීය පරීක්ෂණ හා විමර්ශන හෝ නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් -<br><br>I. මාස 06ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා,<br>II. මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා,<br>III. මාස 03ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02ක් සඳහා ලකුණු ලබා දිය හැක) | <br><br><br><br><br>25<br>15<br>05 | **25** |
| **03** | **අතිරේක පළපුරුද්ද**<br><br>බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන් -<br><br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 20ක්<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02 | | **20** |
| **04** | **ඉංග්‍රීසි භාෂා කුසලතාවය**<br><br>ඉංග්‍රීසි භාෂාව පිළිබඳව රජය පිළිගත් ආයතනයකින් ලබාගත්<br><br>- උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>- ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>- සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | <br><br><br><br>10<br>07<br>04 | **10** |
| **05** | **පරිගණක සාක්ෂරතාව**<br><br>සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, නෞකා යාත්‍රණ, නාවික විද්‍යාව, සාමුද්‍රීය විද්‍යාව හෝ පරිගණක ආශ්‍රිත පුහුණු කිරීම් හා පරීක්ෂණ පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණය / පරිගණක පද්ධති/ පරිගණක යෙදුම් පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් -<br><br>I. මාස 06ක් හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>II. මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>III. මාස 03ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02ක් සඳහා ලකුණු ලබා දිය හැක) | <br><br><br><br><br><br>10<br>05<br>03 | **10** |
| **06** | **සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා** | | **05** |
| | **එකතුව** | | **100** |

(06) අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-

(I) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

(II) සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(III) සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ :-

(*a*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

(*b*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(07) අයදුම්පත් ඉදිරිපත් කිරීම

(I) අයදුම්පත් 2026.07.20 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 79,
ටෙක්නිකල් හන්දිය,
මරදාන පාර,
කොළඹ 10.

(II) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(III) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(IV) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව, රු. 82,150 /= ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(V) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(VI) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(08) ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

(09) පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය.

2026 ජූනි මස 08 දින,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 79,
මරදාන පාර,
කොළඹ 10.

ඇමුණුම 3

### ආදර්ශ අයදුම්පත්‍රය

*වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ*
*සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු/ නැව් තට්ටු) තනතුර සඳහා අයදුම් පත්‍රය*

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල-1/දෙමළ-2/ඉංග්‍රීසි-3)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

***සටහන :*** අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

01. අයදුම්කරුගේ නම:

i. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ...........................................................................................
(උදා- GUNAWARDHANA, H.M.S.K. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ii. සම්පූර්ණ නම : ..............................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

iii. සම්පූර්ණ නම : ..............................................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

02. ලිපිනය හා දුරකථන අංකය:

i. කාර්යාලීය ලිපිනය : .........................................................................................................................
දුරකතන අංකය : ................................................................

ii. පෞද්ගලික ලිපිනය : .......................................................................................................................
දුරකතන අංකය : ................................................................
ජංගම දුරකතන අංකය : ......................................................

03. උපන් දිනය :
අවුරුද්ද : ................................ මාසය : ................................... දිනය : ..................................

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු: ................................ මාස : ................................... දින : ..................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

06. ස්ත්‍රී / පුරුෂ භාවය : ........................................................

07. විවාහක/ අවිවාහක/ වැන්දඹු ද යන වග : ......................................................

08. අධ්‍යාපන සුදුසුකම් :

| සුදුසුකම | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් :

| සුදුසුකම | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර :

*නාවික වෘත්තීය පළපුරුද්ද :*

| නෞකාවේ නම | නෞකාවේ ධාරිතාව | නෞකාවේ දරන ලද තනතුර | සේවා කාලය | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | මාස | දින | |
| | | | | | |

11. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාවය :

i. උපාධිය ..................................................................................
ii. ඩිප්ලෝමාව ..................................................................................
iii. සහතික පත්‍ර පාඨමාලාව ......................................................................

12. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේද? ..........................................
මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදු වන බවත් මම දනිමි.

.........................................,
අත්සන.

දිනය : .........................................

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................. මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ ඇය ................................ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම :
තනතුර :
ලිපිනය :
දිනය :

14. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වුවන් සඳහා පමණක් අදාළ වේ.)
මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන ...................................................... මහතා/ මහත්මිය/ මෙනවිය දැනට ............................ තනතුරේ සේවය කරන බවත් ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බව හා එසේ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

............................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

............................................
දිනය.

06 - 218/1

---

## වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ සහකාර නැව් ගමන් නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2026

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ සහකාර නැව් ගමන් නිලධාරි තනතුර සඳහා මෙහි දෙවන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. සහකාර නැව් ගමන් නිලධාරි | 01 |

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය : 2026.07.20

(01) බඳවාගැනීමේ ක්‍රමය:

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා, පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

(02) අවශ්‍ය සුදුසුකම්:

(i) *අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :*

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| සහකාර නැව් ගමන් නිලධාරි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යා, වාණිජ්‍ය, කළමණාකරණය, ආර්ථික විද්‍යාව හෝ නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම | අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පලපුරුද්ද අමතර/විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ |

(ii) *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iii) *වයස් සීමාව :*
අවුරුදු 21 ට නොඅඩු - අවුරුදු 35 ට නොවැඩි

(iv) *වෙනත් සුදුසුකම් :*

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

***සටහන.*-** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(03) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:

I. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ සහකාර නැව් ගමන් නිලධාරි, නැව් ගමන් නිලධාරි යන තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තාවූද, මතුවට කරනු ලබන්නාවූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

II. අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

(04) වැටුප් පරිමාණය:
MN 4-2025
රු. 53,060-10 X 800-11 X 1,190-10 X 1,320- 5 X 1,350- රු. 94,100

(05) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **01** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | **20** |
| | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් විද්‍යා, වාණිජ්‍ය, කළමණාකරණය, ආර්ථික විද්‍යාව හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා | 20 | |
| | II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් විද්‍යා, වාණිජ්‍ය, කළමණාකරණය, ආර්ථික විද්‍යාව හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා | 10 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |
| **02** | **පළපුරුද්ද** | | **25** |
| | නාවික ක්ෂේත්‍රයට අදාලව රාජ්‍ය / අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක සමාන්තර හෝ ඉහල තනතුරක සේවය කර ලබාගත් පළපුරුදු කාලසීමාව වෙනුවෙන් | | |
| | - එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 25ක් | | |
| | - මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු කාලසීමාවක් සඳහා : ලකුණු 02 | | |
| **03** | **ජාත්‍යන්තර නීතිය, නාවික නීතිය, නාවික කටයුතු සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතිය පිළිබඳව පිළිගත් ආයතනයකින් ලබා ගත් ඩිප්ලෝමා සහතිකයක් සඳහා** | 20 | **20** |
| **04** | **ඉංග්‍රීසි හෝ දෙමළ/සිංහල භාෂාවට ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්** | | **10** |
| | රජය පිළිගත් ආයතනයකින් ලබාගත් | | |
| | - උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| | - ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 07 | |
| | - සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 04 | |
| | **බැගින් උපරිමය ලකුණු 10** | | |
| **05** | **පරිගණක දැනුම** | | **20** |
| | තොරතුරු තාක්ෂණය / පරිගණක පද්ධති/ පරිගණක යෙදුම් පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් | | |
| | I. මාස 06ක් හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 20 | |
| | II. මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 13 | |
| | III. මාස 03ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 06 | |
| **06** | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය සඳහා** | | **05** |
| | **එකතුව** | | **100** |

(06) අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-

(I) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

(II) සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(III) සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(*a*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(*b*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(07) අයදුම්පත් ඉදිරිපත් කිරීම

(I) අයදුම්පත් 2026.07.20 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 79,
ටෙක්නිකල් හන්දිය,
මරදාන පාර, කොළඹ 10.

(II) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(III) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "සහකාර නැව් ගමන් නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(IV) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම්කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව, රු. 82,150 /= ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(V) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(VI) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(08) ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

(09) පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය.

2026 ජුනි මස 08 දින,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 79,
මරදාන පාර,
කොළඹ 10.

ඇමුණුම 4

## ආදර්ශ අයදුම්පත්‍රය

*වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ*
*සහකාර නැව් ගමන් නිලධාරි තනතුර සඳහා අයදුම් පත්‍රය*

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | | | |
|---|---|---|---|

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල-1/දෙමළ-2/ඉංග්‍රීසි-3) (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

***සටහන :-*** අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

01. අයදුම්කරුගේ නම:

i. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ....................................................................................
(උදා- GUNAWARDHANA, H.M.S.K. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ii. සම්පූර්ණ නම : ..................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

iii. සම්පූර්ණ නම : ..................................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

02. ලිපිනය හා දුරකථන අංකය:

i. කාර්යාලීය ලිපිනය : ............................................................................................................
දුරකතන අංකය : ................................................................

ii. පෞද්ගලික ලිපිනය : ............................................................................................................
දුරකතන අංකය : ................................................................
ජංගම දුරකතන අංකය : ......................................................

03. උපන් දිනය
අවුරුද්ද : ................................. මාසය : ................................... දිනය : ...................................

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු : ................................. මාස : ................................... දින : ...................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

06. ස්ත්‍රී / පුරුෂ භාවය : ........................................................

07. විවාහක/ අවිවාහක/ වැන්දඹු ද යන වග : ......................................................

08. අධ්‍යාපන සුදුසුකම් -

| සුදුසුකම | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් -

| සුදුසුකම | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර :

| සේවා කළ ආයතනය | තනතුර | එම තනතුරට අදාළ කාර්යයන් සැකෙවින් | සේවා කාලය | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

11. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාවය

i. උපාධිය ..................................................................................

ii. ඩිප්ලෝමාව ..................................................................................

iii. සහතික පත්‍ර පාඨමාලාව .......................................................................

12. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේද? ..........................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදු වන බවත් මම දනිමි.

.........................................,
අත්සන.

දිනය .........................................

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත්කරන .................................. මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ ඇය ................................ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම -
තනතුර -
ලිපිනය -
දිනය -

14. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදාළ වේ.)
මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන ...................................................... මහතා/ මහත්මිය/ මෙනවිය දැනට ............................. තනතුරේ සේවය කරන බවත් ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත් , විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බව හා එසේ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

............................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

............................................
දිනය.

06 - 218/2

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 ජූලි මස 20 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මැයි මස 29 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | මහව | පහළ විසිදෙකේ කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වන්නි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | ඉබ්බාගමුව | ඉහළ විසිදෙකේ බස්නාහිර කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | අලව්ව | දඹදෙණිය උඩුකහ දකුණු අලව්ව කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ දඹදෙණි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | උඩුබද්දාව | කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

06 - 227

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**මාතර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න හා මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 ජූලි මස 20 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මැයි මස 29 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | මාතර | මාතර නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

06 - 228

---

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශිෂ්‍ය නිලධාරි/ශිෂ්‍ය නිලධාරිනී පුරප්පාඩු - ඉදුරාම බඳවාගැනීම්**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත ශාඛාවන් සඳහා නිත්‍ය / ස්වේච්ඡා නිලධාරින් ලෙස අධිකාරියට පත්කොට ඉදුරාම බඳවා ගැනීම් යටතේ බඳවා ගැනීමට සුදුසු පිරිමි / කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

(අ) ගුවන්යානා ඉංජිනේරු (පිරිමි/කාන්තා)
(ආ) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු (පිරිමි)
(ඇ) සිවිල් ඉංජිනේරු (පිරිමි/කාන්තා)
(ඈ) දන්ත වෛද්‍ය (පිරිමි/කාන්තා)
(ඉ) ප්‍රාසාංගික කලා (පිරිමි)
(ඊ) කෘෂි (පිරිමි)
(උ) පශු වෛද්‍ය (පිරිමි/කාන්තා)
(ඌ) විගණන (පිරිමි/කාන්තා)

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

3. වෘත්තීය / ශාස්ත්‍රීය සුදුසුකම් :

(අ) ගුවන්යානා ඉංජිනේරු ශාඛාව

(1) ගුවන්යානා ඉංජිනේරු නිලධාරි - (ගඟන/ ගුවන් යානා/ යාන්ත්‍රික /මෙකාට්‍රොනික්ස්/

මෝටර් රථ යාන්ත්‍රික) - පිරිමි / කාන්තා (නිත්‍ය / ස්වේච්ඡා)

ගෘහන/ ගුවන් යානා/ යාන්ත්‍රික / මෙකාට්‍රොනික්ස්/ මෝටර් රථ යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම. IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

මොරටුව විශ්වවිද්‍යාලයෙන් ලබාදෙන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික තාක්ෂණය ඩිප්ලෝමාව (NDT) හෝ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතනයෙන් (SLIATE) මගින් පිරිනමන ලද යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ තාක්‍ෂණ ඉංජිනේරු ආයතනය මගින් පිරිනමන ලද යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES) ලබා තිබීම. City and Guilds of London Institute විසින් නිකුත් කරන ජාතික සුදුසුකම් රාමුව (National Qualification Framework) තුළ 5 වන මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ ඊට සමාන සුදුසුකමක්. IESL හි අනුබද්ධ සාමාජිකත්වය (Association Membership) අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**(2) පර්යේෂණ ඉංජිනේරු නිලධාරි - ගෘහන/ ගුවන් යානා/ යාන්ත්‍රික /මෙකාට්‍රොනික්ස්/ විදුලි/ ද්‍රව්‍ය ඉංජිනේරු - (නිල ඇඳුම් නොවන කාණ්ඩය) පිරිමි / කාන්තා (ස්වේච්ඡා)**

ගෘහන/ගුවන් යානා/ යාන්ත්‍රික/ මෙකාට්‍රොනික්ස්/ විදුලි/ ද්‍රව්‍ය ඉංජිනේරු විෂයයන්ගෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධියක් (BSc. Honours) IESL හි අනුබද්ධ සාමාජිකත්වය අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

මෙම සුදුසුකම් ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් දිවයින මට්ටමේ ඉහළ ශ්‍රේණිගත වීමක් "රජයේ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා ඇති අය" අවසාන වසරේ ව්‍යාපෘතිය ඇතුළුව සාර්ථකව නිමකරන ලද උසස් තත්ත්වයේ ව්‍යාපෘති" එය සිදු කළ ආයතනය සහ පෙර පර්යේෂණ ව්‍යාපෘතිවල අත්දැකීම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**(3) ගුවන්යානා ඉංජිනේරු නිලධාරි (රසායන ඉංජිනේරු) පිරිමි / කාන්තා (ස්වේච්ඡා)**

රසායනික තාක්‍ෂණික විෂයයෙහි විශේෂ (ගෞරව) විද්‍යාවේදී උපාධියක් (BSc Honours) තිබීම. රසායනික ද්‍රව්‍ය භාවිතා කරමින් මතුපිට ප්‍රතිකාර (Surface Treatment) ක්ෂේත්‍රයේ පෙර අත්දැකීම් තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**(ආ) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ශාඛාව**

විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු නිලධාරීන් - පිරිමි (නිත්‍ය)

පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව/ යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් හෝ ඉලෙක්ට්‍රොනික / විදුලි සංදේශ ප්‍රධාන විෂයක් ලෙස අන්තර්ගත භෞතික විද්‍යා උපාධියක් ලබා තිබීම හෝ ඉලෙක්ට්‍රොනික/ විදුලි සංදේශ ඉංජිනේරු/ තාක්ෂණය පිළිබඳව උසස් ඩිප්ලෝමාවක් / ඩිප්ලෝමාවක් ලබා තිබීම. අදාළ ක්ෂේත්‍රයේ මාස (06) ක පළපුරුද්දක් ලබා තිබීම හා IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**(ඇ) සිවිල් ඉංජිනේරු ශාඛාව**

(1) සිවිල් / යාන්ත්‍රික / විදුලි /ද්‍රව්‍ය ඉංජිනේරු නිලධාරීන් - පිරිමි / කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

(අ) සිවිල් / යාන්ත්‍රික / විදුලි /ද්‍රව්‍ය ඉංජිනේරුවරයකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) (සාමාජිකත්වය වරලත් ඉංජිනේරු).

(ආ) සිවිල් / යාන්ත්‍රික / විදුලි /ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සහකාර සාමාජිකත්වය ලබා තිබීම.

(ඇ) ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය (BTech) හදාරා තිබීම.

(ඈ) සිවිල් / යාන්ත්‍රික / විදුලි /ද්‍රව්‍ය ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) / ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) / උසස් ජාතික ඩිප්ලෝමාව

(HNDE) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම සහ ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරුවන්ගේ ආයතනයේ (IIESL) සාමාජිකත්වය ලබා තිබීම.

**(ඈ) දන්ත වෛද්‍ය අංශය :**

(1) දන්ත වෛද්‍ය නිලධාරි - පිරිමි/කාන්තා (නිත්‍ය /ස්වේච්ඡා)

BDS (ශ්‍රී ලංකා) උපාධිය හෝ ඕනෑම පිළිගත් විදේශීය විශ්ව විද්‍යාලයකින් ඊට සමාන දන්ත වෛද්‍ය උපාධියක් සහිතව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචි වී තිබීම.

(2) දන්ත වෛද්‍ය සිසුන් - පිරිමි/කාන්තා (නිත්‍ය)

07-08 වන අධ්‍යයන වාරයේ (4 වන වසරට සමාන) ඉගෙනුම ලබන සිසුන් හෝ BDS (ශ්‍රී ලංකා) උපාධි වැඩසටහනේ (05 වන වසරට සමාන) අධ්‍යයන වාර 08 (Semester 08) සාර්ථකව සම්පූර්ණ කර ඇති සිසුන්.

(3) පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (නිත්‍ය)

බී.ඩී.එස්. BDS (Sri Lanka) දන්ත වෛද්‍ය උපාධියක් හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත් විදේශීය රටක ඕනෑම පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඊට සමාන දන්ත වෛද්‍ය උපාධියක් සම්පූර්ණ කර ඇති සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ තාවකාලික ලියාපදිංචිය ලබා නොගත් උපාධිලාභීන් ද, සලකා බලනු ලැබේ, විදේශීය දන්ත වෛද්‍ය උපාධිධාරී අපේක්ෂකයින් බඳවාගත් දින සිට වසර පහක් (5) ඇතුළත (ERPDS) විභාගය සමත්වීම සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබාගත යුතු ය.

**(ඉ) ප්‍රාසාංගික කලා ශාඛාව**

තූර්ය වාදක පාලක - සංගීතය (ශබ්ද පරිපාලක) - පිරිමි (නිත්‍ය)

(1) පිළිගත් විශ්ව විද්‍යාලයකින් සංගීතය විෂයය සම්බන්ධව ලබා ගත් උපාධියක් (සජීවී ශබ්ද පරිපාලනය පිළිබඳව වෘත්තීය පළපුරුද්ද);

*හෝ*

(2) පිළිගත් විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාලයකින් සජීවී ශබ්ද පරිපාලනය පිළිබඳ උපාධියක්;

*හෝ*

(3) පිළිගත් ආයතනයකින් සජීවී ශබ්ද පරිපාලනය පිළිබඳව ලබාගත් ඩිප්ලෝමාවක්.

**(ඊ) කෘෂි ශාඛාව**

කෘෂි නිලධාරි පිරිමි (නිත්‍ය)

කෘෂි විද්‍යාව /උද්‍යාන විද්‍යාව/ භූ දර්ශනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

**(උ) පශු වෛද්‍ය ශාඛාව**

පශු වෛද්‍ය නිලධාරි - පිරිමි / කාන්තා (නිත්‍ය / ස්වේච්ඡා)

(1) පශු වෛද්‍යවේදී උපාධිය (BVSc) හෝ එයට සමාන උපාධියක් සමග ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ (SLVC) ලියාපදිංචි වී තිබීම;

*හෝ*

(2) මාස 06 ක සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීමට යටත්ව ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ (SLVC) ලියාපදිංචිය අපේක්ෂිත පශු වෛද්‍යවේදී උපාධිධාරීන්;

*හෝ*

(3) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාව හා පශු වෛද්‍ය විද්‍යාපීඨයේ පශු වෛද්‍යවේදී උපාධි පාඨමාලාවේහි අධ්‍යනය වාර (Semester) 08 ක් හෝ ඊට වැඩි අධ්‍යන වාර ගණනක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

(4) රැකියා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

**(ඌ) විගණන ශාඛාව**

අභ්‍යන්තර විගණන නිලධාරි - පිරිමි/කාන්තා (නිත්‍ය)

(1) ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වාණිජවේදී / කළමනාකරණ / ගණකාධිකරණ හෝ ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව උපාධියක් ලබා තිබීම සහ විගණන ආයතනයක හෝ විගණන නොවන ආයතනයක වසර එකත් (01) වසර තුනත් (03) අතර සේවා පළපුරුද්දක් පැවතීම සමග

පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් හෝ කිහිපයක් පැවතීම.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධි කාරීවරයෙකු විය යුතු ය. (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ පක්ෂාංගය);

*හෝ*

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරක ආයතනයේ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයෙකු හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA).

*හෝ*

(ඇ) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA) සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු ලෙස සුදුසුකම් ලබා තිබීම;

*හෝ*

(ඈ) ශ්‍රීලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකු (CBA) වීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA) ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධි කාරීවරුන්ගේ ආයතනයේ (CMA) ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

(2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකු (CBA) වීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA) ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA) ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම සහ විගණන හෝ විගණන නොවන අංශයක අවම වශයෙන් වසරක (1) වෘත්තීය පළපුරුද්දක් පැවතීම.

4. පළපුරුද්ද :

ඉහත සුදුසුකම් වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) හෝ ඊට වැඩි පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

5. මූලික අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර, ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටීම අනිවාර්ය වේ. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) මෙහි දී තාක්ෂණ වෘත්තීන් (ගුවන්යානා ඉංජිනේරු ශාඛාව, විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ශාඛාව) සඳහා ඉදුරාම බැඳීමට අපේක්ෂා කරන පශ්චාත් උපාධිය හෝ අවශ්‍යය මට්ටමට ඉහළ වෘත්තීය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ඉල්ලුම් කරන මූලික අධ්‍යාපන ප්‍රවේශ සුදුසුකම් ලෙස ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම හෝ දෙවන වරට ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට සලකා බලනු ලැබේ.

***සටහන් -*** NVQ Level 3 හෝ ඉහළ සහතිකයක් හෝ SLQF Level 1 හෝ ඉහළ සහතිකයක් ලබා සිටීම ඉහත 5 'අ' ඡේදයේ හි සඳහන් අ.පො.ස (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් වෙනුවට සලකා බලනු ලැබේ.

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් එක් වරක දී ඕනෑම අංශයකින් අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු යි.

***සටහන් -*** NVQ Level 4 හෝ ඉහළ සහතිකයක් හෝ NVQ Level 2 හෝ ඉහළ සහතිකයක් ලබා සිටීම ඉහත 5 'අ' ඡේදයේ හි සඳහන් අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සුදුසුකම් වෙනුවට සලකා බලනු ලැබේ.

(ඇ) ***විශේෂ සටහන් :*** Person Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් 06ක් සඳහා එක් වරක දී අ.පො.ස

(සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහල අගයක් සඳහා ලබාදෙන සාමාර්ථයන් ලබා තිබිය යුතු ය. තවද Pearson Edexcel International Ordinary (GCSE) or Cambridge Exam Qualification විභාගවල දී සිංහල හෝ දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් නොමැති අපේක්ෂකයින් බඳවාගනු ලබන දින සිට වසර පහක් ඇතුළත සිංහල හෝ දෙමළ භාෂාව සඳහා අවශ්‍ය සාමාර්ථය ලබා ගත යුතු ය.

Pearson Edexcel/ Cambridge - International Advanced Level විභාගයන්ට පෙනී සිටි සිසුන් ඉහත ශාඛාවන් සඳහා අයදුම් කිරීමේදී, එම අදාළ එක් එක් විෂයයන් සඳහා අ.පො.ස. (උ/පෙළ) විභාගයේ සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඉන් ඉහල අගයක් ලබා තිබිය යුතු ය.

6. මූලික සුදුසුකම් :-

(අ) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය

(ආ) සිවිල් තත්ත්වය : විවාහක / අවිවාහක

(ඇ) වයස : සියලු ශාඛාවන්

2026 අගෝස්තු මස 01 වන දිනට (පලමු කාණ්ඩය)
2026 දෙසැම්බර් මස 01 වන දිනට (දෙවන කාණ්ඩය)
පිරිමි/ කාන්තා - අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 32 ට නොවැඩි විය යුතු යි.

(ඈ) උස : පිරිමි - සෙන්ටිමීටර් 165 (අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතු ය.
කාන්තා -සෙන්ටිමීටර් 160 (අඩි 5 යි අඟල් 3) ක් හෝ ඊට වැඩි විය යුතු ය.

(ඉ) බර : පිරිමි $17 <$ ශරීර ස්කන්ධ දර්ශකය $< 26$
කාන්තා $17 <$ ශරීර ස්කන්ධ දර්ශකය $< 25$

ශරීර ස්කන්ධ දර්ශකය = $\dfrac{\text{බර (කි. ග්‍රෑ.}}{\text{උස (මී)}^2}$

(ඊ) පපුව : අඟල් 32" ට නොඅඩු විය යුතු යි (පිරිමි)

(උ) වර්ණ දෘෂ්ඨිකත්වය : සීපී2

(ඌ) පෙනීම : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් / කාච රහිතව) (දන්ත වෛද්‍ය ශාඛාව අපේක්ෂකයින් උපැස් රහිතව ඇස්වල පෙනීම 6/18 තෙක් වන අයෙක් නම් එය උපැස් සහිතව 6/6 තත්වයට තිබීම අනිවාර්ය වේ).

7. විශේෂ සටහන් :-

(අ) ඉහත සඳහන් 2, 3 සහ 6 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිනුම් වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් විශේෂ කුසලතාවක් නොමැති නම් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

(ආ) තෝරාගනු ලබන අපේක්‍ෂකයින් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් / ෆ්ලයින් ඔෆිසර් / ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් යන නිලයන්හි අධිකාරියට පත් කරනු ලැබේ.

වෛද්‍යවරුන් සහ විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සඳහා ස්කොඩ්‍රන් ලීඩර් නිලය හෝ විංග් කමාන්ඩර් නිලයෙහි අධිකාරියට පත් කරනු ලැබේ.

(ඈ) තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් හට ලිඛිත, ප්‍රායෝගික පරීක්ෂණයකට සහ නිලධාරි ගුණාංග පරීක්ෂාව සඳහා පෙනී සිටීමට සිදුවේ.

(ඈ) තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(ඉ) සියලුම මූලික හා ශාස්ත්‍රපති උපාධින් සහ ඩිප්ලෝමාවන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට සනාථ කළ යුතු ය.

(ඊ) යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි සපුරා නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක්/ දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අභිමතය පරිදි ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(උ) ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඌ) රාජ්‍ය භාෂා අවශ්‍යතා :- තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති සහ මතු පනවනු ලබන්නා වූ නියෝග සහ රෙගුලාසි පිළිපැදිය යුතු ය.

(එ) තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන ස්ථානයකදී පුහුණුවක් ලැබිය යුතු ය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසි වලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේ ය.

(ඒ) වෛද්‍ය පරීක්ෂණය සමත්වන සියලුම ශාඛාවන්වල අයදුම්කරුවන් නිලධාරි ගුණාංග පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එහිදී සාර්ථකවන සියලුම අයදුම්කරුවන් අදාල සහ අවශ්‍ය පරිදි අනුගත කිරීමේ වැඩසටහන (Familiarization Training) සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයන් වෙත කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණ වලින් සාර්ථකවන සියළුම අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ශාඛාව සඳහා වන අයදුම්කරුවන් සංඛ්‍යාව සහ අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා පොරොත්තු ලේඛනයට (standby list) අයදුම්කරුවන් තෝරා ගැනීම කුසලතා ලැයිස්තුව අනුව සිදුකරන අතර සියලුම සම්මුඛ පරීක්ෂණ සහ සෙසු පරීක්ෂණ අවසානයේ අවසාන කුසලතා ලැයිස්තුව පිළියෙල කරනු ලැබේ. තමන්ට පවතින යම් නිධන්ගත රෝගයක්, ආබාධයක් පිළිබඳව ඉතිහාසය සහවන හෝ යම් රෝගයකට නියම කරන ලද ඖෂධ පිළිබඳව හෙළි නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

(ඔ) සෑම තෝරාගනු ලබන අපේක්ෂකයෙකුම 1951 අප්‍රේල් මස 27 වන දින අංක 10,240 දරන *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි අදාළ වේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක." කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසි වලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

(ඕ) පොරොත්තු ලේඛනයේ (standby list) සිටින අයදුම්කරුවන් හට අවස්ථාව සලසා දීම සඳහා අවසන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අනුයුක්ත වීම සඳහා වන අවසාන තීරණය අවසන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ එය අවසන් වූ වහාම ප්‍රකාශයට පත් කළ යුතු ය. අවසන් සම්මුඛ පරීක්ෂණය සමත්ව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එක්වීමට නොහැකි බව නොදන්වා අවසාන බඳවා ගැනීමට නොපැමිණෙන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කිසිදු ඉදිරි අයදුම්කිරීමක් සඳහා සලකා බලනු නොලැබේ.

(ක) දුර්වල හැකියාවන් සහිත සහ නිවැරදි ආකල්ප, හැදියාවන්, චර්යාරටා නොදරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

(ග) ගුවන් හමුදා නිලධාරින් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද අනුයුක්ත කිරීමට යටත් වේ.

(ච) සියලුම නිලධාරින් ගුවන් හමුදා පනතට සහ විටින් විට පනවනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

(ජ) අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ වාසය කල යුතු ය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවයද සපයනු ලැබේ.

ට. විවාහක නිලධාරින්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරින් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 8. ඇ. (11) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

8. වැටුප් හා දීමනා :

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරින්ගේ එක් එක් නිළයන් සඳහා වැටුප් පහත සඳහන් පරිදි වේ. තවද පහත දක්වා ඇති සියලුම ඒකාබද්ධ වැටුප් ශ්‍රේණියේ ආරම්භක පියවර බව සටහන් කළ යුතු ය.

| *වර්ෂය* / *නිළය* | ***(DMS 05/2025) - වාර්ෂිකව*** |
|---|---|
| ඔෆිසර් කැඩෙට් | Rs. 656,040.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | Rs. 790,560.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නොවන) | Rs. 861,960.00 |
| ෆ්ලයින් ඔෆිසර් | Rs. 985,800.00 – (30x Rs.28,800.00) = Rs.1,849,800.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | Rs. 1,158,600.00 – (24x Rs.28,800.00) = Rs.1,849,800.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | Rs. 1,273,800.00 – (22x Rs.28,800.00) = Rs.1,907,400.00 |
| විංග් කමාන්ඩර් | Rs. 1,309,080.00 – (17x Rs.35,280.00) = Rs.1,908,840.00 |

(ආ) වෛද්‍ය නිලධාරින්ගේ වැටුප් -

| *වර්ෂය* / *නිළය* | ***(PAC 10/2025) - වාර්ෂිකව*** |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | Rs.1,129,800.00 – 2 x Rs.28,800.00 – 7 x 29040.00 – 2 x Rs.35,280.00 – 16 x Rs.46,800.00) = Rs.2,210,040.00 |
| 2 වන ශ්‍රේණිය | Rs. 1,216,440.00 – 6 x Rs.29040.00 - 2x Rs.35,280.00 – 16 x Rs.46,800.00) = Rs.2,210,040.00 |
| 1 වන ශ්‍රේණිය | Rs. 1,508,040.00 (15x Rs.46,800.00) = Rs.2,210,040.00 |
| විශේෂ ශ්‍රේණිය | Rs. 1,872,000.00 (12x Rs.58,200.00) = Rs.2,570,400.00 |

(ඇ) අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා.

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 1,700.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - | රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - | රු. 3,400.00 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 3,400.00 (මසකට) |

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 2,125.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - | රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - | රු. 400.00 (මසකට) |

(3) විවේකකාල රාජකාරී බටා ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 70,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරී දීමනාව

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 795.00 (පැයකට) |
| 2 වන ශ්‍රේණිය | - | රු. 957.00 (පැයකට) |
| 1 වන ශ්‍රේණිය | - | රු. 1,291.00 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 1,542.00 (පැයකට) |

(5) 11. ඇ. (17) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඈ) දීමනා සහ අනෙකුත් පහසුකම්.

(1) ජීවන වියදම් දීමනාව මසකට රු. 17,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කල පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ (නිත්‍ය සේවා පුද්ගලයින් සඳහා පමණි).

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00 ක් ගෙවනු ලැබේ (දිනකට රු .20.00 ක් ගෙවනු ලැබේ)

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ (දිනකට රු. 100.00 ක් ගෙවනු ලැබේ).

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව - එයාර් කොමඩෝර් නිලයේ සිට ඉහළ නිලයන් සඳහා මසකට රු. 600.00 ක් ද ගෲප් කැප්ටන් නිලයේ සිට පහළ නිලයන් සඳහා මසකට රු. 525.00 ක් ද ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ.

(9) ආහාර දීමනාව මසකට රු. 36,008.36 ක් ගෙවනු ලැබේ (දිනකට රු. 1,161.56 ක් ගෙවනු ලැබේ).

(10) සුදුසුකම් වේතනය අදාල පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින් හට නිවාස කුළී දීමනාව මසකට- රු.3,200.00 සිට රු.8,500.00 දක්වා හිමිවේ.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිලය සිට මසකට රු.1,875.00 සිට රු. 3,750.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට /බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුල වාසය කරන නිලධාරීන්ට මසකට වරක් කඳවුරේ සිට තම නිවසට ළඟම නගරයට යෑමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාල අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි).

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුල රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරිම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 ක් ගෙවනු ලැබේ (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිලධාරින් හට පමණි).

(19) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිලධාරින් හා දන්ත නිලධාරින් සඳහා පමණයි).

(20) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි).

(21) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x 2/3 මසකට උපරිම දින 3 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි).

(22) අමතර රාජකාරී ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරි සඳහා පමණයි).

(23) දුරකථන බිල් දීමනාව -

විශේෂඥ වෛද්‍ය නිලධාරි - රු. 6,000.00 (මසකට)
වෛද්‍ය නිලධාරි - රු. 3,000.00 (මසකට)

(24) වරලත් ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 සිට රු.30,000.00 දක්වා මාසිකව ගෙවනු ලැබේ (අදාල වනුයේ සුදුසුකම් ලත් වරලත් ඉංජිනේරු නිලධාරින් හට පමණි).

(25) වරලත් වාස්තු විද්‍යාඥ දීමනාව මසකට රු.15,000.00 සිට රු.30,000.00 දක්වා මාසිකව ගෙවනු ලැබේ (අදාළ වනුයේ සුදුසුකම් ලත් වරලත් ඉංජිනේරු නිලධාරින් හට පමණි).

9. විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා : 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය සහ විටින් විට කරනු ලැබූ එහි සංශෝධනයන්ට අනුව විශ්‍රාම වැටුප් පරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව සිදුකරනු ලැබේ.

10. ඉල්ලුම්කරුවන්ට උපදෙස් :

(අ) අයදුම්කරුවන් පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතේ සියලුම ඡේදයන් නිවැරදිව හා පිළිවෙලකින් යුක්තව සම්පූර්ණ කළයුතු අතර පළමු කණ්ඩායම සඳහා **ඉල්ලුම්පත් 2026 ජුනි මස 30 වන දින දහවල් 1200** ට ප්‍රථම ලැබෙන සේ **"ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ගුවන් හමුදා ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, ඒකළ, කොටුගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකල යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ "............................... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතුය. එසේම අයදුම්කරුවන් ඉල්ලුම්පත් යොමුකිරීම <u>www.airforce.lk/joinus/apply</u> යන වෙබ් අඩවිය හරහාද යොමු කල හැකිය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ / සංස්ථා / මණ්ඩල / සිවිල් ආයතනයන් හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල /සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතු ය.

(ඇ) අන්තර්ජාල පහසුකම් ඇති අයදුම්කරුවන් <u>www.airforce.lk/joinus/apply</u> යන වෙබ් අඩවිය හරහා අයදුම්පත් යොමුකිරීම කළ හැකි අතර එසේ පහසුකම් නොමැති අයදුම්කරුවන් සඳහා ඉහත 10 (අ) හි සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු ය.

(ඈ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග **සහතික කරන ලද** ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යාවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය වලංගු නොවේ).

(2) ජාතික හැඳුනුම්පත.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්.

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(5) මාස 06ක් ඇතුලත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය.

(6) ක්‍රීඩා සහතික හා විෂයය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

(7) මාස හයක් (6) ඇතුලත ලබාගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය.

(9) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(10) අඟල් 2 x 2 ½ ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායා රූප දෙකක්.

(ඉ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපෙක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

(ඊ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(උ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා අස්ථානගත වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

(ඌ) අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, උස, වයස, පපු වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්ත මත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වලදී ඉවත් කරණු ලැබේ.

11. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙලිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙලිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වේ.

12. තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණ :-

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුරු සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කල යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීටම උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(ඉ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

(වීබී එදිරිසිංහ),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී,
(සිව්වරක්), යූඑස්පී,
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී, කිව්එච්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාපති .

ගුවන් හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
තැ.පෙ. 594
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ...................................................................................... ශාඛාවේ**
**අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :- ..........................................................................................................................................
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) : .........................................................................................
..........................................................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................................

4. ඉල්ලුම් කරන ශාඛාව : ..............................................................................................................................

5. ඉල්ලුම් කරන තනතුර : ............................................................................................................................

6. ස්ථිර ලිපිනය : ..........................................................................................................................................

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ...................................................................................................

8. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර : .........................................................................................

9. අධ්‍යාපනය ලැබූ පාසල : ...........................................................................................................................

10. තැපැල් ලිපිනය: ........................................................................................................................................

11. විද්‍යුත් ලිපිනය: ......................................................................................................................................

12. උපන් දිනය : ............................................................................................................................................
වයස :

| ඉල්ලුම්කරන කණ්ඩායම | වයස 2026 අගෝස්තු මස 01 ට දිනට (පළමු කාණ්ඩය)<br>2026 දෙසැම්බර් මස 01 ට දිනට (දෙවන කාණ්ඩය) |
|---|---|
| වයස | අවුරුදු : ............. මාස : ............. දින : ............. |

13. උස : සෙන්ටිමීටර් ................... .(අඩි......... අඟල් ...........)

14. පපුව : අඟල් ...........(පිරිමි අයදුම්කරුවන් සඳහා පමණි)

15. බර : කිලෝග්‍රෑම් .........

16. දිස්ත්‍රික්කය : ...........................................................................................................................................

17. ඡන්ද කොට්ඨාසය : ....................................................................................................................................

18. ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය : .....................................................................................................

19. දුරකථන අංක : ........................................................................................ WhatsApp අංක : ..........................

20. විවාහක හෝ අවිවාහක බව : ........................................................................................................................

21. පාසැල් සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :-

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | අ.පො.ස. (උ.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| විශ්වවිද්‍යාලයේ නම | | | | |
| විශ්වවිද්‍යාල/ වෙනත් සුදුසුකම් | උපාධිය/ ඩිප්ලෝමාව | | | |
| | ඕනෑම වෘත්තීය ආයතනයක සාමාජිකත්වයක් දරා තිබේ ද? | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :

23. පාසලෙන් /විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කල රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

24. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | දැනට ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා :- | | | | |
| මව :- | | | | |
| සහෝදර සහෝදරියන්ගේ :- | | | | |
| | | | | |
| | | | | |

25. ලේ ඥාතීන් කවරෙකු හෝ දැනට හෝ කලින් ගුවන් හමුදා සේවයක් වේනම් ඒ පිළිබඳව විස්තර :
(දැනට සේවයෙන් ඉවත් ව ගොස් ඇත්නම් ඉවත් වූ අකාරය සඳහන් කරන්න)

| නිළය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |

26. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර :- (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න)

| අනු අංක | විස්තරය | පාසල් | පලාත් | ජාතික | අන්තර්ජාතික |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

27. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න.) :
..........................................................................................................................................................................................

28. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය : ......
..........................................................................................................................................................................................

29. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම්කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. : ..........................................
..........................................................................................................................................................................................

30. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ................................
..........................................................................................................................................................................................

31. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු: ................
..........................................................................................................................................................................................

32. චරිත සහතික පිළිබඳ විස්තර :-

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

33. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :-

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය :- ........................................ .................................................,

ඉල්ලුම්කරුගේ අත්සන.

34. ඉල්ලුම්කරුගේ මව / පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(*අ*) ඉහත අයදුම්පතේ 33 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ........................................................................................................... නමැති අපේක්ෂකයාගේ මව / පියා / භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරාගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි:

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී ඉහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම / ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු / ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

.......................................................................,

දෙමව්පිය / භාරකරුගේ අත්සන.

දිනය :...............................................

නම :..............................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :.........................................................................................................................................................

..................................................................

පළමුවන සාක්ෂිකරුගේ අත්සන

දිනය :...............................................

නම :..............................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :.........................................................................................................................................................

.................................................................,

දෙවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : ..............................................

06 - 237/1

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ආධුනික ශිෂ්‍යභට නිලධාරී සහ ආධුනික ශිෂ්‍යභට නිලධාරිනී පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවල ආධුනික ශිෂ්‍යභට නිලධාරී සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරින් සඳහා පුරප්පාඩු පවතී.

   (අ) නියමු පොදු රාජකාරී ශාඛාව (පිරිමි/කාන්තා)
   (ආ) මෙහෙයුම් ගුවන් ශාඛාව (ගුවන් ගමන් පාලක) (පිරිමි/කාන්තා)
   (ඇ) ගුවන්යානා ඉංජිනේරු ශාඛාව (පිරිමි/කාන්තා)
   (ඈ) සැපයුම් ශාඛාව (පිරිමි)
   (ඉ) රෙජිමේන්තු ශාඛාව (පිරිමි/කාන්තා)
   (ඊ) පරිපාලන ශාඛාව (පිරිමි/කාන්තා)

2. ඒ සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි / කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

3. **විශේෂ සුදුසුකම් (උපාධි වැඩසටහන)** - BSc (Aviation Studies) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පිළිගත්) උපාධි වැඩ සටහන යටතේ ඇතුලත්වීම සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන්, තම අයදුම්පත්‍රයේ අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල සඳහන් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන වග ද සඳහන් කළ යුතු ය.

   **(අ) නියමු පොදු රාජකාරී / මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් පාලක) ශාඛාවන් (පිරිමි/කාන්තා) - නිත්‍ය**

   (1) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය.

   (2) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව / ජීව විද්‍යා විෂය ධාරාව (භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුලත්ව තිබිය යුතුය) හෝ තාක්ෂණය විෂය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව අනිවාර්ය විෂයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය) එක් වරක දී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු යි.

   **(ආ) ගුවන්යානා ඉංජිනේරු ශාඛාව (පිරිමි/කාන්තා) - නිත්‍ය**

   (1) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය.

   (2) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයන් ලෙස ඇතුලත්ව තිබිය යුතුය) හෝ තාක්ෂණය විෂය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය අනිවාර්ය විෂයයන් ලෙස ඇතුලත්ව තිබිය යුතු ය.) එක් වරකදී විෂයයන් තුනම සමත්ව අවම වශයෙන් ඉන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ ලබා සිටිය යුතු ය.

   (ඇ) සැපයුම් ශාඛාව (පිරිමි) - නිත්‍ය

   (1) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය.

   (2) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය / තාක්ෂණවේදය හෝ කලා විෂය ධාරාවෙන් ආර්ථික විද්‍යා විෂයය ඇතුලුව විෂයයන් 3 කට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු ය.

   **(ඈ) රෙජිමේන්තු/පරිපාලන ශාඛාවන් (පිරිමි/කාන්තා) - නිත්‍ය**

   (1) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය.

(2) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය /තාක්ෂණවේදය / කලා යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු ය.

4. *විශේෂ සටහන් :* Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයන් ඇතුළුව විෂයයන් 06ක් සඳහා එක් වරක දී අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබාදෙන සාමාර්ථයන් ලබා තිබිය යුතු ය. තව ද, Pearson Edexcel International Ordinary (GCSE), Cambridge exam qualification විභාගවල දී සිංහල හෝ දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් නොමැති අපේක්ෂකයින්, බඳවාගනු ලබන දින සිට වසර පහක් ඇතුළත සිංහල හෝ දෙමළ භාෂාව සඳහා අවශ්‍ය සාමාර්ථය ලබා ගත යුතු ය.

Pearson Edexcel / Cambridge - International Advanced Level විභාගයන්ට පෙනී සිටි සිසුන් ඉහත ශාඛාවන් සඳහා අයදුම් කිරිමේ දී, අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී එම ශාඛාවන් සඳහා වෙන් වෙන්ව දක්වා ඇති විෂය පථයන් සහ එක් එක් විෂයයන් සඳහා ලබා ගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඉන් ඉහළ අගයන් සඳහා ලබා දෙන සාමාර්ථයන් ලබා තිබිය යුතු ය.

5. අනෙකුත් සුදුසුකම් : අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු යි.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය |
| (ආ) | වයස | : | පළමු කණ්ඩායම සඳහා - 2026 අගෝස්තු 01 වන දිනට<br>දෙවන කණ්ඩායම සඳහා - 2026 දෙසැම්බර් 01 වන දිනට<br>අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 22 ට නොවැඩි විය යුතු යි. |
| (ඇ) | උස | : | පිරිමි - සෙන්ටිමීටර් 165 (අඩි 5 යි අඟල් 5 කට නොඅඩු විය යුතු යි)<br>කාන්තා - සෙන්ටිමීටර් 160 (අඩි 5 යි අඟල් 3 කට නොඅඩු විය යුතු යි). |
| (ඈ) | බර | : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26<br>කාන්තා 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25<br>ශරීර ස්කන්ධ දර්ශකය = $\frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$ |
| (ඉ) | පපුව | : | පිරිමි - අඟල් 32 ට නොඅඩු විය යුතු යි. |
| (ඊ) | වර්ණ දෘෂ්ටිකත්වය | : | සීපී 2 |
| (උ) | පෙනීම | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් / කාච රහිත) |
| (ඌ) | විවාහක/අවිවාහකභාවය | : | අපේක්ෂකයින් අවිවාහක විය යුතු යි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේදී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. |

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතාවයන් සඳහා විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

7. ඉහත සඳහන් 3, 4 සහ 5 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිනුම් වලට අනුව උස, පෙනීම හා බර නොමැති සහ විශේෂ කුසලතා නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

8. යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති සුදුසුකම් නියමිත පරිදි සපුරා නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයන් / සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අභිමතය පරිදි ඔහු / ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

9. සේවා කොන්දේසි :

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව සාර්ථකව නිමවීමෙන් පසු ඔහු / ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිළයෙන් වෙනස්ව නියමු නිලධාරි නිළයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයින් සූදානමින් සිටිය යුතු යි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව පුද්ගලයන් ගුවන් හමුදා නීතියට යටත් විය යුතු යි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියළුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුලින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ දෙමව්පියන් හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු / ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයාගේ දෙමව්පියන් හෝ භාරකරු විසින් එතෙක් ඔහු / ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපතිතුමා සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

(ඌ) දෙමව්පියන් හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 34 වෙනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග මේ බව තහවුරු කරන බැඳුම්කරයකට බැඳිය යුතු ය.

(එ) තෙවන, හතරවන සහ පස්වන ඡේදයේ පරිදි සුදුසුකම් සපුරා ඇති අපේක්‍ෂකයින්, ඔවුන් අයදුම්කරන ලද අභිමතාර්ථ ශාඛාවන් තුන පදනම් කරගෙන මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. නියමු පොදු රාජකාරී ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් මූලික සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත්වීමෙන් අනතුරුව ගුවන් නියමුවන් සඳහා වන විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට කැඳවනු ලැබේ. තමන්ට පවතින යම් නිධන්ගත රෝගයක්, ආබාධයක් පිළිබඳ ඉතිහාසය සඟවන හෝ යම් රෝගයකට නියම කරන ලද ඖෂධ පිළිබඳ හෙළි නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

(ඒ) වෛද්‍ය පරීක්ෂණය සමත්වන සියලුම ශාඛාවන්වල අයදුම්කරුවන් නිලධාරි ගුණාංග පරීක්ෂණය (Officer Quality Test) සඳහා කැඳවනු ලැබේ. නියමු පොදු රාජකාරී ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් නිලධාරි ගුණාංග පරීක්ෂණයෙන් සමත් වුවහොත් පියාසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණ වලින් සාර්ථකවන සියලුම අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ශාඛාව සඳහා වන

අයදුම්කරුවන් සංඛ්‍යාව සහ අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා පොරොත්තු ලේඛනයට (Standby list) අයදුම්කරුවන් තෝරා ගැනීම ලබාගත් ලකුණු අනුව සිදුකරන අතර සියළුම සම්මුඛ පරීක්ෂණ සහ සෙසු පරීක්ෂණ අවසානයේ අවසාන ප්‍රතිඵල සටහන පිළියෙල කරනු ලැබේ.

(ඔ) නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් ගුවන් නියමු යෝග්‍යතා පරීක්ෂණයෙන් (Flying Aptitude Test) අසමත් වුවහොත් ඉදිරි සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඉවත්වීමට හෝ පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් ලබා දෙන වෙනත් ශාඛාවක් වෙත ඇතුලත්වීමට අවස්ථාවක් හිමිවන අතර ඒ සඳහා එම අදාළ ශාඛාව සඳහා සෘජුවම අයදුම්කරන ලද අයදුම්කරුවන්ගේ නිලධාරි ගුණාංග පරීක්ෂණය (Officer Quality Test) දක්වා ලබාගත් ලකුණු මත පදනම්ව අවස්ථාවක් හිමිවේ. ගුවන් නියමු යෝග්‍යතා පරීක්ෂණය අසමත් වන අයදුම්කරුවන්හට ඉදිරියේදී නැවත නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා ඉල්ලුම් කිරීමට නොහැකි වේ.

(ඕ) පොරොත්තු ලේඛනයේ (Standby list) සිටින අයදුම්කරුවන් හට අවස්ථාව සලසාදීම සඳහා, අවසන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අනුයුක්ත වීම සඳහා වන අවසාන තීරණය අවසන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ එය අවසන් වූ වහාම ප්‍රකාශයට පත් කළ යුතු ය. අවසන් සම්මුඛ පරීක්ෂණය සමත්ව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එක්වීමට නොහැකි බව නොදන්වා අවසාන බඳවා ගැනීමට නොපැමිණෙන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කිසිදු ඉදිරි අයදුම්කිරීමක් සඳහා සලකනු නොලැබේ.

(ක) දුර්වල හැකියාවන් සහිත සහ නිවැරදි ආකල්ප, හැදියාවන්, චර්යාරටා නොදරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

(ග) අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ සිටිය යුතු යි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරී නිවස්නයට ගෙවනු ලැබේ.

(ච) විවාහක නිලධාරින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(ජ) සියළුම නිලධාරින් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ට) සියලුම නිලධාරින් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

10. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

11. වැටුප් හා දීමනා :

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ එක් එක් නිළයන් සඳහා වැටුප් පහත සඳහන් පරිදි වේ. තව ද පහත දක්වා ඇති සියලුම ඒකාබද්ධ වැටුප් ශ්‍රේණියේ ආරම්භක පියවර බව සටහන් කළ යුතු ය.

| *වර්ෂය* / *නිළය* | ***(DMS 05/2025) - වාර්ෂිකව*** |
|---|---|
| ඔෆිසර් කැඩෙට් | Rs. 656,040.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | Rs. 790,560.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නොවන) | Rs. 861,960.00 |
| ෆ්ලයින් ඔෆිසර් | Rs. 985,800.00 – (30x Rs.28,800.00) = Rs.1,849,800.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | Rs. 1,158,600.00 – (24x Rs.28,800.00) = Rs.1,849,800.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | Rs. 1,273,800.00 – (22x Rs.28,800.00) = Rs.1,907,400.00 |
| විංග් කමාන්ඩර් | Rs. 1,309,080.00 – (17x Rs.35,280.00) = Rs.1,908,840.00 |

(ආ) වෛද්‍ය නිලධාරින්ගේ වැටුප් -

| *වර්ෂය* / *නිළය* | ***(PAC 10/2025) - වාර්ෂිකව*** |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | Rs.1,129,800.00 – 2 x Rs.28,800.00 – 7 x 29040.00 – 2 x Rs.35,280.00 – 16 x Rs.46,800.00) = Rs.2,210,040.00 |
| 2 වන ශ්‍රේණිය | Rs. 1,216,440.00 – 6 x Rs.29040.00 - 2x Rs.35,280.00 – 16 x Rs.46,800.00) = Rs.2,210,040.00 |
| 1 වන ශ්‍රේණිය | Rs. 1,508,040.00 (15x Rs.46,800.00) = Rs.2,210,040.00 |
| විශේෂ ශ්‍රේණිය | Rs. 1,872,000.00 (12x Rs.58,200.00) = Rs.2,570,400.00 |

(ඇ) අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිලධාරින් සඳහා.

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)
විශේෂ ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 2,125.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 400.00 (මසකට)

(3) විවේකකාල රාජකාරී බටා
ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 70,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරී දීමනාව

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 795.00 (පැයකට)
2 වන ශ්‍රේණිය - රු. 957.00 (පැයකට)
1 වන ශ්‍රේණිය - රු. 1,291.00 (පැයකට)
විශේෂ ශ්‍රේණිය - රු. 1,542.00 (පැයකට)

(5) 11. ඇ. (17) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඈ) දීමනා සහ අනෙකුත් පහසුකම් :

(1) ජීවන වියදම් දීමනාව මසකට රු. 17,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ (නිත්‍ය සේවා පුද්ගලයින් සඳහා පමණි).

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00 ක් ගෙවනු ලැබේ (දිනකට රු. 20.00 ක් ගෙවනු ලැබේ).

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ (දිනකට රු. 100.00 ක් ගෙවනු ලැබේ).

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ගෙවනු ලැබේ.

(7) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව - එයාර් කොමඩෝර් නිළයේ සිට ඉහල නිළයන් සඳහා මසකට රු. 600.00 ක් ද ගෲප් කැප්ටන් නිළයේ සිට පහල නිළයන් සඳහා මසකට රු. 525.00 ක් ද ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ.

(9) ආහාර දීමනාව මසකට රු. 36,008.36 ක් ගෙවනු ලැබේ (දිනකට රු. 1,161,56 ක් ගෙවනු ලැබේ).

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින් හට නිවාස කුළී දීමනාව මසකට- රු.3,200.00 සිට රු.8,500.00 දක්වා හිමිවේ.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිළය සිට මසකට රු.1,875.00 සිට රු. 3,750.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට /බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුල වාසය කරන නිලධාරින්ට මසකට වරක් කඳවුරේ සිට තම නිවසට ළඟම නගරයට යෑමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම්. (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි)

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුල රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි ශාඛාවේ නියමුවන් සඳහා ගෙවනු ලැබේ.

(19) ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 ක් ගෙවනු ලැබේ. (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිලධාරීන් හට පමණි)

(20) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිලධාරීන් හා දන්ත නිලධාරීන් සඳහා පමණයි)

(21) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(22) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x 2/3 මසකට උපරිම දින 3 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(23) අමතර රාජකාරී ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරී සඳහා පමණයි)

(24) දුරකථන බිල් දීමනාව
- විශේෂඥ වෛද්‍ය නිලධාරි - රු. 6,000.00 (මසකට)
- වෛද්‍ය නිලධාරි - රු. 3,000.00 (මසකට)

(25) වරලත් ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 සිට රු.30,000.00 දක්වා මාසිකව ගෙවනු ලැබේ. (අදාළ වනුයේ සුදුසුකම් ලත් වරලත් ඉංජිනේරු නිලධාරීන් හට පමණි)

(26) වරලත් වාස්තු විද්‍යාඥ දීමනාව මසකට රු.15,000.00 සිට රු.30,000.00 දක්වා මාසිකව ගෙවනු ලැබේ. (අදාළ වනුයේ සුදුසුකම් ලත් වරලත් ඉංජිනේරු නිලධාරීන් හට පමණි)

12. විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා : 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය සහ විටින් විට කරනු ලැබූ එහි සංශෝධනයන්ට අනුව විශ්‍රාම වැටුප් පරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව සිදුකරනු ලැබේ.

13. අයදුම්කරුවන්ට උපදෙස් :

(අ) අයදුම්කරුවන් පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතේ සියලුම ඡේදයන් නිවැරදිව හා පිලිවෙලකින් යුක්තව සම්පූර්ණ කළ යුතු අතර ඉල්ලුම්පත් 2026 ජුනි මස 30 වන දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ “ආධුනිකයින් බඳවා ගැනීමේ ප්‍රධාන නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනිමේ ප්‍රධාන කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, ඒකල, කොටුගොඩ” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ආධුනික ශිෂ්‍යභට නිලධාරි/ආධුනික ශිෂ්‍යභට නිලධාරිනී සඳහා ඉල්ලුම්පත්” යනුවෙන් සටහන් කළ යුතු ය. එසේම අයදුම්කරුවන් ඉල්ලුම්පත් යොමුකිරීම www.airforce.lk/joinus/apply යන වෙබ් අඩවිය හරහා ද යොමු කළ හැකි ය. එක් අයදුම්කරුවෙක්ට එක් අයදුම්පතක් තුළින් තමාගේ කැමැත්ත සහ සුදුසුකම් අනුව ශාඛාවන් තුනක් සඳහා ඉල්ලුම්කළ හැකි අතර අයදුම් කරන ශාඛාවන්ගෙන් මූලික සුදුසුකම් වඩාත්ම සපුරාලන එක් ශාඛාවකට පමණක් මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. තව ද, කැඳවීම් කරනු ලබන ශාඛාවෙහි පරීක්ෂණයන්ගෙන් අසමත්වුවහොත් සහ එම ශාඛාවන් සඳහා පුරප්පාඩු තිබේනම් පමණක් අයදුම් කරන අනෙක් ශාඛාවන් දෙක සඳහා සම්මුඛ පරීක්ෂණයන් වෙත කැඳවීම ගුවන් හමුදාධිපතිතුමාගේ අභිමතය මත සිදු වේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. අයදුම්කර ඇති ශාඛා තුනෙන් කුමන ශාඛාවක් සඳහා හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අවසන් තීරණය ගුවන් හමුදාධිපතිතුමා සතු වේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) අන්තර්ජාල පහසුකම් ඇති අයදුම්කරුවන් www.airforce.lk/joinus/apply යන වෙබ් අඩවිය හරහා අයදුම්පත් යොමුකිරීම කළ හැකි අතර එසේ පහසුකම් නොමැති අයදුම්කරුවන් සඳහා ඉහත 13 (අ) හි සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු ය.

(ඈ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරන ලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යාවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කළ සහතිකය වලංගු නොවේ).

(2) ජාතික හැඳුනුම්පත.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල් පිටපත් හා එහි ඡායාපිටපත බැගින් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතු ය.)

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල් පිටපත්.

(5) මාස 06ක් ඇතුලත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත්.

(7) මාස හයක් (6) ඇතුළත ලබාගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය.

(9) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(10) අහල් 2x2 ½ ප්‍රමාණයේ ග්‍රාමනිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායා රූප දෙකක්.

(ඉ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

(ඊ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතු ය.

(උ) අයදුම්පත සමඟ සහතික ල මුල් පිටපත් එවා, ඒවා අස්ථානගත වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

(ඌ) අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපු වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්ත මත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වල දී ඉවත් කරනු ලැබේ.

14. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේ නම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

15. තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණ :

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන් ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු / ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) තෝරාගැනීමේ පරීක්ෂණයන් අතරතුර සියලු අයදුම්කරුවන් හට ලිඛිත, ප්‍රායෝගික හා නිලධාරි ගුණාංග පරීක්ෂණයන් (Officer Quality Test) සඳහා පෙනී සිටීමට සිදුවේ.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහු / ඇය පිළිබඳ සහතිකයක් ලබා දීමෙන් පමනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙලඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතුවන්නේ ය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

(වීබී එදිරිසිංහ),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී,
(සිව්වරක්), යූඑස්පී,
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී, කිව්එච්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාපති .

ගුවන් හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
තැ.පෙ. 594
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි/ශිෂ්‍යභට නිලධාරිනි සඳහා ඉල්ලුම්පත**

**ගුවන් හමුදාවේ............................................................................................ ශාඛාව**

| ඉල්ලුම් කරන ශාඛාවන් | | |
|---|---|---|
| 1. | 2. | 3. |

1. පුරවැසිභාවය :- ..........................................................................................................................................
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව)..........................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................................................................

4. ස්ථිර ලිපිනය : ...........................................................................................................................................................

5. තැපැල් ලිපිනය: ..........................................................................................................................................................

6. උපන් දිනය : ...................................................................
වයස : 2026 අගෝස්තු මස 01 ට (පළමු කාණ්ඩය)/2026 දෙසැම්බර් මස 01 ට (දෙවන කාණ්ඩය)

අවුරුදු : ............. මාස : ............. දින : .............

7. උස : සෙන්ටිමීටර් .................... (අඩි......... අඟල් ...........)

8. පපුව : අඟල් .....................(පිරිමි අයදුම්කරුවන් සඳහා පමණයි)

9. බර : කිලෝග්‍රෑම් ....................

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ..............................................................................................................

11. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර : ......................................................................................................

12. දිස්ත්‍රික්කය : ..................................................................................

13. ඡන්ද කොට්ඨාශය : .....................................................................

14. ග්‍රාම නිලධාරී කොට්ඨාශය සහ අංකය : ................................................................................................................

15. දුරකථන අංක : ......................................... WhatsApp අංක : ......................................... විද්‍යුත් ලිපිනය: ..........................

16. විවාහක හෝ අවිවාහක බව : ...................................................................

17. ස්ත්‍රී පුරුෂ භාවය : ...................................................................

18. අධ්‍යාපනය ලැබූ පාසල් :

ප්‍රාථමික : ..................................................................................................................................................
ද්විතීක : ...................................................................................................................................................

19. පාසැල් සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :-

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයන් (ශ්‍රේණි ඇතුළුව)* | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | අ.පො.ස. (උ.පෙළ) (විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්කර යැවීමට සුදුසුකම් ලබා තිබේ ද? නැද්ද ? යන්න සඳහන් කරන්න) ඔව්/ නැත | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | විශ්වවිද්‍යාල/ වෙනත් සුදුසුකම් | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් : ......................................................................................................................

21. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර (අවශ්‍යනම්) :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

22. මව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *ජා.හැ.ප. අංකය* | *රැකියාව* | | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|---|
| | | *පෙර* | *දැනට* | |
| පියා :- | | | | |
| මව :- | | | | |
| සහෝදර සහෝදරියන්ගේ :- | | | | |
| | | | | |
| | | | | |

23. ඔබගේ ලේ ඥාතීන් කවරෙකු හෝ දැනට හෝ මීන් පෙර සන්නද්ධ සේවයේ නියුතුව සිටියේ නම් ඒ පිළිබඳව විස්තර :
(දැනට සේවයේ නියුතු නම් ඒ පිළිබඳවත් සේවයෙන් ඉවත් ව ගොස් ඇත්නම් ඉවත් වූ ආකාරය, නීතිමය ගැටලු ද, ඇතුලත්ව සඳහන් කරන්න).

| *නිළය* | *නම* | *ශාඛාව/වෘත්තිය* | *වර්තමාන තත්ත්වය* | *විස්තරය* |
|---|---|---|---|---|
| | | | | |

24. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර :-
(ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා)

| *අනු අංක* | *විස්තරය* | *පාසල්* | *පළාත්* | *ජාතික* | *අන්තර් ජාතික* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

25. පාසලේ දී හෝ බාහිර වෙනත් ආයතනවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න.) : ......................
..........................................................................................................................................................................

26. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය : .....
..........................................................................................................................................................................

27. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම්කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න.ඃ ..............................................
..........................................................................................................................................................................

28. මීට පෙර ගුවන් හමුදා චීන වරාය කඳවුරෙහි පැවැත්වෙන ගුවන් නියමු යෝග්‍යතා පරීක්ෂණයට සහභාගී වී තිබේද නැද්ද යන වග සඳහන් කරන්න : ..........................................................................................................................................

29. ඔබ ශ්‍රී ලංකා ගුවන් හමුදා සම්මුඛ පරීක්ෂණයකට සහභාගි වී තිබේනම් සහභාගි වූ වර්ෂය/මාසය කැඳවීමේ අංකය සඳහන් කරන්න :
(*අ*) වර්ෂය :.................................................. මාසය : .................................... කැඳවීමේ අංකය :................................
(*ආ*) ප්‍රතිඵලය : සමත්/ අසමත්

30. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. ඃ .................................
..........................................................................................................................................................................

31. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතුඃ ......
..........................................................................................................................................................................

32. චරිත සහතික පිළිබඳ විස්තර :-

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

33. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :-

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පල වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළවන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය :- ....................................... ................................................,

ඉල්ලුම්කරුගේ අත්සන.

34. ඉල්ලුම්කරුගේ මව / පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(*අ*) ඉහත අයදුම්පතේ 33 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ............................................................................................................ නැමැති අපේක්ෂකයාගේ මව / පියා / භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාලසීමාව තුළ දී ඉහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම / ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු / ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

......................................................................,

දෙමව්පිය / භාරකරුගේ අත්සන.

දිනය : ..............................................

නම : ....................................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය : .............................................................................................................................................................

...................................................................,

පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : ..............................................

නම : ....................................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය : .............................................................................................................................................................

.................................................................,

දෙවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : ..............................................

නම : ....................................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය : .............................................................................................................................................................

06 - 237/2

### ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාව

ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව පුරප්පාඩු පවතින අතර ඒ සඳහා අවම සහ විශේෂ සුදුසුකම් පහත දක්වා ඇත.

**මූලික අධ්‍යාපන සුදුසුකම් :**

2. සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු ය.

**වෘත්තීය සහ අදාළ අධ්‍යාපන හා විශේෂිත සුදුසුකම් :**

3. එක් එක් වෘත්තීන් සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් පරිදි වේ.

(අ) ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා) - නිත්‍ය / ස්වේච්ඡා

(1) ගුවන්යානා සැකිලි ශිල්පී (පිරිමි/කාන්තා) - නිත්‍ය
(2) ගුවන්යානා යන්ත්‍ර ශිල්පී (පිරිමි/කාන්තා) - නිත්‍ය
(3) ගුවන්යානා විදුලි සහ මෙවලම් ශිල්පී (පිරිමි/ කාන්තා) - නිත්‍ය
(4) ගුවන්යානා ආරක්ෂක උපකරණ ශිල්පී (පිරිමි/ කාන්තා) - නිත්‍ය

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සමත්ව ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය හෝ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබා ගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා තිබීම.

*සහ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් තාක්ෂණික විද්‍යාපීඨයක් මගින් පිරිනමන ලද වසර දෙකක පූර්ණකාලීන ඉංජිනේරු ශිල්පීය පුහුණු (Electronics / Electrical) ජාතික සහතිකය හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු පාඨමාලාවක් සමත් අයදුම්කරුවන් සඳහා ගුවන්යානා විදුලි සහ මෙවලම් ශිල්පී වෘත්තියට බඳවා ගැනීමේ දී ප්‍රමුඛත්වය දෙනු ලැබේ. තව ද ජාතික වෘත්තීය නිපුණතා (NVQ) මට්ටමේ සුදුසුකම් හෝ වෙනත් පිළිගත් ආයතනයකින් යාන්ත්‍රික විෂයයන් පිළිබඳ පුහුණුව සහ සේවා පළපුරුද්ද ලබා ඇති අයවලුන් හට ගුවන්යානා සැකිලි ශිල්පී සහ ගුවන්යානා යන්ත්‍ර ශිල්පී යන වෘත්තීන් සඳහා බඳවා ගැනීමේ දී ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

(5) ගුවන්යානා සැකිලි ශිල්පී (පිරිමි/කාන්තා) - ස්වේච්ඡා

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය/විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ සියලු

විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) හෝ ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඉංජිනේරු සැලසුම් ශිල්පී පාඨමාලා සහතිකයක් තිබිය යුතු ය (ජාතික වෘත්තීය සුදුසුකම් අදියර III හෝ IV හෝ ඒ හා සමාන සහතිකයක්).

(*ආ*) සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා) - නිත්‍ය

(1) අවි ආයුධ ශිල්පී (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය/විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) හෝ ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(2) රථවාහන කාර්මික ශිල්පී (පිරිමි) - නිත්‍ය
(3) ගුවන් යානා භූමි ආධාරක උපකරණ කාර්මික ශිල්පී (පිරිමි) - නිත්‍ය
(4) මතුපිට කාර්මික ශිල්පී (පිරිමි) - නිත්‍ය
(5) ගුවන් ඡායාරූප ශිල්පී (පිරිමි/ කාන්තා) - නිත්‍ය
(6) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී (පිරිමි) - නිත්‍ය
(7) ගුවන්යානා පැස්සුම් ශිල්පී (පිරිමි) - නිත්‍ය
(8) ලියවන පට්ටල් ශිල්පී (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවන් සහිතව ගණිතය/ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) හෝ ගණිතය විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

තව ද, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික සහතිකය හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(9) ප්‍රවාහන ක්‍රියාකරු (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හතරකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හතරකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

වලංගු සැහැල්ලු වාහන බලපත්‍රයක් හෝ වලංගු බර වාහන බලපත්‍රයක් ලබා ඇති අයවලුන් හට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

(ඇ) විද්‍යුත්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා) - නිත්‍ය

(1) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි) - නිත්‍ය
(2) විදුලි සංනිවේදන කාර්මික ශිල්පී (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ, ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය සහ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

(3) දුරකථන ක්‍රියාකරු (පිරිමි) - නිත්‍ය
(4) ගුවන් විදුලි සන්නිවේදක (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂය ඇතුළුව ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(5) පරිගණක කාර්මික ශිල්පී (පිරිමි/ කාන්තා) - නිත්‍ය

සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවලදී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව ගණිතය සහ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම;

*සහ*

පිලිගත් ආයතනයක ජාතික වෘත්තීය මට්ටමේ සුදුසුකම් (NVQ) සහ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා පරිගණක කාර්මික ශිල්පි වෘත්තිය සඳහා අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඈ) වෛද්‍ය වෘත්තීන් (පිරිමි) - නිත්‍ය/ස්වේච්ඡා

(1) හෙද සහායක (පිරිමි) - නිත්‍ය/ස්වේච්ඡා

සිංහල / දෙමළ, ගණිතය/විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂයය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය

යුතු අතර ඉන් ගණිතය හෝ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සහ වෙනත් එක් විෂයයක් සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විද්‍යා / ගණිත/ කෘෂි විද්‍යා විෂය ධාරාවන්ගෙන් හදාරා සමත්ව තිබීම අමතර සුදුසුකමක් වන අතර එය අනාගතයේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තිය පුහුණු පාඨමාලාවන් හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

(2) දන්ත සහයක (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදි විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය, සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සහ වෙනත් එක් විෂයකට සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සාමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා තිබීම.

ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙළ) විභාග සමත්ව තිබීම සහ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විෂයයන් තුනක් එක් වරක දී සමත්ව තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඉ) පරිපාලන වෘත්තීන් (පිරිමි / කාන්තා) - නිත්‍ය

(1) පරිපාලන සහයක (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

පරිගණක පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) ගිණුම් සහයක (පිරිමි/ කාන්තා) - නිත්‍ය

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය / ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය / ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන

සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

පරිගණක පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඊ) මෙහෙයුම් වෘත්තීන් (පිරිමි / කාන්තා) - නිත්‍ය/ ස්වේච්ඡා

(1) මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් සේවා සහයක සහ ගුවන් ආරක්ෂණ පද්ධති ක්‍රියාකරු) (පිරිමි) - නිත්‍ය

සිංහල /දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි විෂය සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහල අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

(2) ගිනි නිවන්නා (පිරිමි) - නිත්‍ය

සිංහල /දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

හෝ

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂයය ඇතුලුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) මෙහෙයුම් භූමි (පිරිමි / කාන්තා) - නිත්‍ය, (කාන්තා) - ස්වේච්ඡා

සිංහල /දෙමළ භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(4) මෙහෙයුම් භූමි (පිරිමි) - ස්වේච්ඡා

වාර දෙකකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය ඕනෑම විෂයයන් දෙකක් සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් දෙකක් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(5) සුනඛ පාලක ( පිරිමි ) - නිත්‍ය

සිංහල /දෙමළ භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(6) කෘෂි සහයක ( පිරිමි ) - නිත්‍ය/ස්වේච්ඡා

සිංහල /දෙමළ භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(ඩ) සැපයුම් වෘත්තීන් ( පිරිමි ) - නිත්‍ය/ ස්වේච්ඡා

(1) සැපයුම් සහායක ( පිරිමි ) - නිත්‍ය
(2) ගුවන් ඉන්ධන තත්ව පාලක ( පිරිමි )- නිත්‍ය

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතය / විද්‍යාව / ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුලුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය හෝ ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය හෝ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සාමාන හෝ ඊට ඉහල අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) සලාක සහයක (පිරිමි) - නිත්‍ය/ස්වේච්ඡා

සිංහල/ දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

(4) භෝජනාගාර සහයක (පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාග වල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා ඇති අයවළුන් හට ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

(ඍ) විනයාරක්ෂක වෘත්තීන් ( පිරිමි ) - නිත්‍ය

(1) ගුවන් හමුදා පොලිසිය ( පිරිමි ) - නිත්‍ය

සිංහල / දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

උස අඩි 5 අඟල් 8ට වැඩි පිරිමි අයවළුන් හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

(එ) ප්‍රාසාංගික කලා වෘත්තීන් (පිරිමි/කාන්තා) - නිත්‍ය

(1) නර්ථන ශිල්පී (පිරිමි/කාන්තා) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

සාම්ප්‍රදායික හා බටහිර නර්තන ශෛලීන් පිළිබඳ හැකියාව, නර්තනයට සුදුසු ශාරීරික හැඩයක් තිබීම, ජන ගායනයට ඇති හැකියාව, නර්තන වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව, ශබ්ද පරිපාලනය සහ අංග රචනය සඳහා ඇති හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(2) සංගීතඥ ( පිරිමි) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

බටහිර / පෙරදිග සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව/ගායනය, බටහිර / පෙරදිග සංගීත ස්වර ප්‍රස්ථාර කියවීම සහ ලිවීමේ හැකියාව, අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සංගීත විෂයේ (බටහිර / පෙරදිග) න්‍යාය හෝ ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම හා පාසලේ බටහිර/ශිෂ්‍ය භට/බ්‍රාස් තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයකු වීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඒ) ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි/කාන්තා) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level

විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

ජාතික මට්ටමේ ලබාගත් ක්‍රීඩා ජයග්‍රහණ විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් විශේෂ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන්ද සමත්විය යුතු ය.

(ඔ) ඉදිකිරීම් ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) - නිත්‍ය/ ස්වේච්ඡා

(1) කම්මල්කරු හා පෑස්සුම්කරු (පිරිමි) - නිත්‍ය/ ස්වේච්ඡා
(2) දැව තාක්ෂණික ශිල්පී (පිරිමි) - නිත්‍ය/ ස්වේච්ඡා
(3) ඉදිකිරීම් තාක්ෂණික ශිල්පී (පිරිමි) - නිත්‍ය/ ස්වේච්ඡා
(4) වායුසමීකරණ හා ශීතකරණ කාර්මික ශිල්පී (පිරිමි ) - නිත්‍ය
(5) කාර්මික තාක්ෂණික ශිල්පී ( පිරිමි ) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

තව ද, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද 3 වන මට්ටමේ හෝ ඊට වැඩි ජාතික සහතිකයක් සහ සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(6) ඇලුමිනියම් පිරිසැකසුම්කරු ( පිරිමි ) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

තව ද, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද (NVQ Level III) සහතිකය හෝ වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(7) ප්‍රමාණ සමීක්ෂණ සහකාර ( පිරිමි ) - නිත්‍ය/ස්වේච්ඡා

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

රජයේ කාර්මික විද්‍යාලවලින් ලබාගත් ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික සහතිකයක් හෝ ඊට සමාන අනුමත සුදුසුකමක් (ජාතික වෘත්තීය සුදුසුකම් / ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම්) තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී**

4. අවශ්‍ය අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :

(අ) විද්‍යුත්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ඉංජිනේරු වෘත්තීන් (පිරිමි / කාන්තා) - නිත්‍ය / ස්වේච්ඡා

(1) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි) - නිත්‍ය

(2) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී (පිරිමි / කාන්තා) - නිත්‍ය

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහිතව ගණිතය/ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය හෝ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

*සහ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික (විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික්) පාඨමාලා සහතිකයක් තිබිය යුතු ය. [ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) හෝ ඒ හා සමාන සහතිකයක්]

*හෝ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක වසර තුනක ජාතික තාක්ෂණ සහතිකය (NCT) (ඉලෙක්ට්‍රොනික/ විදුලි) සාර්ථකව නිම කිරීම.

(3) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි) - ස්වේච්ඡා : නිල ඇඳුම් රහිත)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහිතව ගණිතය/ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම]

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුලුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය හෝ සියලු විද්‍යා විෂයයන් : භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහල අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය.

*සහ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික (විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික්) පාඨමාලා සහතිකයක් තිබිය යුතු ය. [ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) හෝ ඒ හා සමාන සහතිකයක්].

*හෝ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක වසර තුනක ජාතික තාක්ෂණ සහතිකය (NCT) (ඉලෙක්ට්‍රොනික/ විදුලි) සාර්ථකව නිම කිරීම.

(*ආ*) ප්‍රාසාංගික කලා වෘත්තීන් (පිරිමි/කාන්තා) - නිත්‍ය

(1) සංගීතඥ (පිරිමි/කාන්තා) - නිත්‍ය

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

බටහිර / පෙරදිග සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව/ගායනය, බටහිර / පෙරදිග සංගීත ස්වර ප්‍රස්ථාර කියවීම සහ ලිවීමේ හැකියාව, අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සංගීත විෂයේ (බටහිර / පෙරදිග) න්‍යාය හෝ ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම හා පාසලේ බටහිර/ශිෂ්‍යභට/බ්‍රාස් තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයකු වීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

පහත සඳහන් සංගීත භාණ්ඩ වාදනය කිරීමට අයදුම්කරුට විශේෂ හැකියාවක් තිබිය යුතු ය.

- ලීඩ් ගිටාර්
- බේස් ගිටාර්
- තබ්ලා
- කී බෝර්ඩ්
- වයලින්
- බටනලා
- ශබ්ද පරිපාලන ශිල්පී
- DJ (පිරිමි/කාන්තා)
-

(*ඇ*) විගණන වෘත්තීන් (පිරිමි/කාන්තා) - නිත්‍ය

(1) විගණන සහයක (පිරිමි/කාන්තා) - නිත්‍ය

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/ ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂයය ඇතුලුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ගණිතය / ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා ගත යුතු ය;

*සහ*

අ.පො.ස. (උ.පෙළ) වාණිජ විෂයය ධාරාවෙන් හදාරා ඉන් සමත්ව තිබීම;

*සහ*

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර I **(AAT Stage I)** සමත්ව තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර II **(AAT Stage II)** සමත්ව තිබීම;

*හෝ*

රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික ආයතනයකින් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා හි පළමු වසර විභාගය සම්පූර්ණ කර තිබීම;

*හෝ*

රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික ආයතනයක උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා හි පළමු වසර විභාගය සම්පූර්ණ කර තිබීම;

*සහ*

අවම වශයෙන් මාස 06ක ගිණුම්කරණය හෝ විගණන පලපුරුද්ද ලබා තිබීම.

(ඇ) වෛද්‍ය වෘත්තීන් (පිරිමි) - ස්වේච්ඡා

(1) හෙද සහයක (පිරිමි) - ස්වේච්ඡා

සිංහල / දෙමළල ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදි විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි, ගණිතය හෝ සියලු විද්‍යා විෂයයන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව) සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සාමාන්‍ය සාමාර්ථයන් ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහල අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ඇතුලුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත් ව තිබිය යුතු ය.

රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතනයකින් සායනික පුහුණුව ඇතුළුව වසරකට නොඅඩු කාලයක් හෙද පුහුණුව ලබා තිබිය යුතු අතර එම සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකපත් ලබා තිබිය යුතු ය. නැතහොත් NVQ Level III හෝ ඊට වැඩි හෙද සහකාර සහතිකයක් තිබිය යුතුය.

(ඉ) මෙහෙයුම් වෘත්තීන් (පිරිමි) - ස්වේච්ඡා

(1) කෘෂි සහයක ( පිරිමි ) - ස්වේච්ඡා (නිළ ඇඳුම් රහිත)

අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටීම.

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටීම.

*සහ*

කෘෂිකර්මාන්තය, කෘෂිකර්මාන්ත ආශ්‍රිත (තවාන් කළමනාකරණය, ආරක්ෂිත ගෘහ තුල වගාව- Protected Culture අංකුර හා බද්ධ කිරීම, මී මැසි පාලනය සහ ආහාර සැකසීම) සහ පශු සම්පත් කළමනාකරණ පාඨමාලා පිළිබඳ ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) සහතිකයක් ලබා තිබීම.

ඒකාබද්ධ අස්වනු නෙළන යන්ත්‍ර, ට්‍රැක්ටර්, සහල් මෝල් සැකසුම් යන්ත්‍ර සහ වෙනත් කෘෂි කාර්මික යන්ත්‍ර ක්‍රියාකරවීම සහ ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම සඳහා සේවා පළපුරුද්දක් ලබා තිබීම.

පැස්සුම් ශිල්පය, ජලනල කාර්මික ශිල්පය, පෙදරේරු ශිල්පය, විදුලි රැහැන් ඇදීම, වාහන ටින්කරින් සහ පින්තාරු කිරීම, ශීත කාමර වල ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව සහ බර වාහන රියදුරු බලපත්‍රය ලබා තිබීම වැනි ඉහතින් ඇති සියල්ල අමතර සුදුසුකම් ලෙස සැලකේ.

(ඊ) අධ්‍යාපනික වෘත්තීන් (කාන්තා) - ස්වේච්ඡා :නිල ඇඳුම් රහිත)

(1) පෙර පාසල් ගුරු (කාන්තා) - ස්වේච්ඡා :නිල ඇඳුම් රහිත)

සිංහල / දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ඉංග්‍රීසි විෂය සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර

(සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුලුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි විෂය සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

රජයේ පිළිගත් ආයතනයකින් පෙරපාසල් ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම;

*සමග*

පෙර පාසල් ගුරුවරයෙකු ලෙස අවම වශයෙන් මාස හයක පශ්චාත් සුදුසුකම් පලපුරුද්ද ලබා තිබීම

*හෝ*

ලියාපදිංචි මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක පෙර පාසල් ගුරුවරයෙකු ලෙස මාස හයකට වැඩි කාලයක් ප්‍රායෝගික පුහුණුව හා පලපුරුද්ද අවශ්‍ය වේ.

පෙර පාසල් ගුරුවරයෙකු සඳහා වූ NVQ 3 මට්ටම හෝ NVQ 4 මට්ටම තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලබන අතර ඔවුන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(ඪ) සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) - ස්වේච්ඡා

(1) ප්‍රවාහන ක්‍රියාකරු (පිරිමි) - ස්වේච්ඡා

වාර දෙකකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය ඕනෑම විෂයයන් හතරක් සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ වාර දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය ඕනෑම විෂයයන් හතරක් සමත්ව තිබීම;

*හෝ*

රිය පැදවීමේ (NVQ 3 මට්ටමේ) සහතිකයක් තිබීම ඇතුලත් වීමේ සුදුසුකමක් ලෙස සැලකේ.

(ණ) සැපයුම් වෘත්තීන් ( පිරිමි / කාන්තා ) - ස්වේච්ඡා

(1) නිල ඇඳුම් පරිස්කාරක ( පිරිමි / කාන්තා ) - ස්වේච්ඡා

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

පිළිගත් ආයතනයක NVQ III මට්ටමේ සුදුසුකමක් හෝ ඊට වැඩි සුදුසුකමක් ඇති සහ රෙදිපිළි කර්මාන්තයේ වෘත්තීන් තුළ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස වසර 2ක සේවා පළපුරුද්දක් ඇති අපේක්ෂකයින්.

රටා සැදීම තත්ත්ව පාලනය සහ කටර් යන්ත්‍ර හැසිරවීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලබන අතර ගුවන් හමුදාව විසින් පවත්වනු ලබන අවසාන ප්‍රායෝගිය පරීක්ෂණය සමත් වීම අනිවාර්ය වේ.

5. විශේෂ සටහන :

(අ) Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) හෝ Cambridge International Ordinary Level විභාගවල දී සිංහල හෝ දෙමළ භාෂාවට සාමාන්‍ය

සාමාර්ථයක් නොමැති අපේක්ෂකයින් බඳවාගත් දින සිට වසර පහක් ඇතුලත සිංහල හෝ දෙමළ භාෂාව සඳහා අවශ්‍ය සාමාර්ථය ලබා ගත යුතු ය.

(ආ) ඉඳුරාම බඳවාගනු ලබන අපේක්ෂකයින්ගේ අ.පො.ස. (සා.පෙළ) වෙනුවට ජාතික වෘත්තීය සුදුසුකම් අදියර III (NVQ III) හෝ ඊට වැඩි සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ පළමු මට්ටම (SLQF 1) හෝ ඊට වැඩි සහ අ.පො.ස. (උ.පෙළ) වෙනුවට ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ IV) හෝ ඊට වැඩි සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ දෙවන මට්ටම (SLQF 2) හෝ ඊට වැඩි සහතිකයන් ලබා සිටීම සලකා බලනු ලැබේ.

6. අනෙකුත් සුදුසුකම් :

(අ) ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතු යි.

(1) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු යි

(2) වයස : 2026 අගෝස්තු මස 01 වන දිනට - පළමු කාණ්ඩය
: 2026 දෙසැම්බර් මස 01 වන දිනට - දෙවන කාණ්ඩය

**නිත්‍ය**
පිරිමි - අවුරුදු 18ත් 23ත් අතර
කාන්තා - අවුරුදු 18ත් 22ත් අතර

**ස්වේච්ඡා**
පිරිමි - අවුරුදු 18ත් 28ත් අතර
පිරිමි - අවුරුදු 18ත් 32ත් අතර (නිල ඇඳුම් රහිත කෘෂි සහයක වෘත්තිය සඳහා)
කාන්තා - අවුරුදු 18ත් 26ත් අතර

**ඉඳුරාම බඳවාගැනීම් (නිත්‍ය/ ස්වේච්ඡා)**
පිරිමි - අවුරුදු 18ත් 28ත් අතර
කාන්තා - අවුරුදු 18ත් 26ත් අතර

(3) උස : අඩි 5 අඟල් 3 ට (159 cm) - නොඅඩු විය යුතු යි (පිරිමි)
: අඩි 5 අඟල් 1 ට (154 cm) - නොඅඩු විය යුතු යි (කාන්තා)

(4) බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)
: 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$$

(5) වර්ණ දෘෂ්ටිය : CP2

(6) පෙනීම : එක් ඇසක් 6/9, ඉතිරි ඇස 6/6 සහ ඇස් දෙකෙහි ම එකවර පෙනීම තීව්‍රතාවය 6/6 (උපැස් හා කාච රහිතව)

(7) පපුව : අඟල් 32ට නොඅඩු විය යුතු ය (පිරිමි)

(8) සිවිල් තත්වය : නිත්‍ය - අවිවාහක
ස්වේච්ඡා/ඉඳුරාම බඳවා ගැනීම් - විවාහක/අවිවාහක

(අ) නිත්‍ය ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතු අතර ගුවන් හමුදාවට බැඳී වසර හතරක් (04) ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(ආ) අවිවාහක වයස අවුරුදු 25 ට වැඩි බඳවා ගන්නා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(ඇ) අවිවාහක ඉදුරාම බඳවා ගන්නා ගුවන් භටයින්/ ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවීමෙන් පසු විවාහ වීමට අවසර දෙනු ලැබේ.

(ඈ) නර්ථන ශිල්පිනී වෘත්තියේ ගුවන් කාන්තාවන් සඳහා ගුවන් හමුදාවට බැඳී වසර පහක (05) කාලයක් ගතවීමෙන් පසුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

7. තුන්වන සහ හතරවන ඡෙදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ හයවන ඡෙදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා නොමැති අපේක්ෂකයින් / අපේක්ෂිකාවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිණුම්වලට අනුව උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන් / අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

8. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

9. සේවා කොන්දේසි :

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය / ස්වේච්ඡා සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. ආධුනිකයා ලබා ඇති වෘත්තීය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු ඔහු / ඇය අදාළ වෘත්තියේ ගුවන්භටයෙකු / ගුවන් කාන්තාවක ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතු ය.

(ඇ) පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතු යි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකුහට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු / ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුදා සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු / ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාපති සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡෙදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 32 වැනි ඡෙදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතු යි.

(එ) පළමුවන ඡෙදයේ සිට හයවන ඡෙදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය

පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාමේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක් වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක ගුවන් භටයින් / ගුවන් කාන්තාවන්, ගුවන්භට / ගුවන් කාන්තා නිවස්නයන් හි සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ ආහාර දීමනා ගුවන්භට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයන්හි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(ඕ) සියලුම ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින්වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

10. බඳවා ගැනීමේ කොන්දේසි :

(අ) නිත්‍ය ගුවන් භටයින් හා ගුවන් කාන්තාවන් සඳහා : තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට / ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතු ය. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාලසීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතු යි. වසර 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත සේවය දීර්ඝ කිරීමට සුදුසු ගුවන්භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(ආ) ස්වේච්ඡා ගුවන් භට/ ගුවන් කාන්තාවන් සඳහාඃ තෝරාගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 05 ක සේවා කාලයකට යටත් විය යුතු යි. වසර 05 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් භට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(ඇ) කෘෂි සහයක (නිල ඇඳුම් රහිත) / පෙර පාසල් ගුරු (නිල ඇඳුම් රහිත) / ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (නිල ඇඳුම් රහිත) ස්වේච්ඡා ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා : තෝරාගනු ලබන අපේක්ෂකයන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 02 ක සේවා කාලයකට යටත් විය යුතු යි. වසර 02 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් භට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

11. රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා රෙගුලාසි පිළිපැදිය යුතු වේ.

12. වැටුප් හා දීමනා :

(අ) නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් භට/ ගුවන් කාන්තාවන්ට අදාළ මූලික වැටුප සහ දීමනා ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *නිලය* | *මූලික වැටුප (රු.)* | *අනෙකුත් දීමනා (රු.)* | *අඩු කිරීම් රහිතව සම්පූර්ණ වැටුප (රු.)* |
|---|---|---|---|
| ගුවන්භට | 46,922.00 | 22,150.00 | 69,072.00 |
| නායක ගුවන්භට | 48,290.00 | 22,150.00 | 70,440.00 |
| කෝප්‍රල් | 49,658.00 | 22,150.00 | 71,808.00 |

***සැලකිය යුතුයි :*** පිටත වාසය කරන ගුවන් භටයින් /ගුවන් කාන්තාවන් හට මසකට රු 30,000.00ක පමණ ආහාර දීමනා සහ අදාළ පරිදි ගෙවල් කුළී දීමනාව ගෙවනු ලැබේ.

(ආ) විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා : වරින්වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්භටයින් / ගුවන් කාන්තාවන් දායක විය යුතු යි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව සිදු කරනු ලැබේ.

13. ඉල්ලුම්කරුට / ඉල්ලුම්කාරියට උපදෙස් :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතු යි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2026 ජුනි මස 30 වන දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ "ආධුනිකයින් බඳවා ගැනීමේ ප්‍රධාන නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු යි (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ) අයදුම්පතේ ඉහළ වම් කෙලවරේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය / ස්වේච්ඡා ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු යි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කළයුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුනා වූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නාවූද ඉල්ලුම්පත් බාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු යි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමග තිබිය යුතු යි.

(ඇ) අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍ර www.airforce.lk/joinus/apply යන වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ඈ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙනවිට අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු යි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ).

(2) ජාතික හැඳුනුම්පත.

(3) අයදුම්කර ඇති වෘත්තීයට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල්පිටපත් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතු ය).

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(5) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මාස 06කට නොඅඩු කාලයකින්). ඉන් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙක් අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත් හා ඡායාපිටපත බැගින්.

(7) මාස හයක් (6) ඇතුලත ලබාගන්නා ලද ග්‍රාම නිළධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය.

(9) කාඩ් බෝඩ් ෆයිල් කවරයක් සහ ෆයිල් ලේස් එකක්

(10) ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද අහල් 2 x 2 1/2 උඩුකය වර්ණ ඡායා රූපයක්.

(ඉ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

(ඊ) වෙනත් ලියකියවිලි හෝ සහතික පත්වල මුල් පිටපත් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය.

(ඪ) අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා, ඒවා අස්ථානගත වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

(ඬ) අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපුවෙහි වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්ත මත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වලදී ඉවත් කරණු ලැබේ.

14. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්හට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

15. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් / අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

16. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ගුවන් හමුදා ප්‍රමිතියට අනුකූලව වෛද්‍ය පරීක්ෂණයට හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු යි.

17. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන් / අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණු අනුවය.

18. අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහු/ ඇය ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙන් පමණි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙලඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතුවන්නේය.

19. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

(වීබී එදිරිසිංහ),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී,
(සිච්චරක්), යූඑස්පී,
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී, කිව්එච්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාපති .

ගුවන් හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
තැ.පෙ. 594
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා ගුවන් හමුදාවේ ආධුනික ගුවන් භට/ ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත**
**ගුවන් හමුදාවේ................................................................................ වෘත්තීය**

1. පුරවැසිභාවය :- ..................................................................................................................................
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) : ........................................................................................................
..................................................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................................................

4. ස්ථිර ලිපිනය : ...........................................................................................................................................

5. තැපැල් ලිපිනය : ............................................................................................................................................

6. උපන් දිනය : ..................................................................

වයස : (පළමු කණ්ඩායම -2026 අගෝස්තු මස 01 වන දිනට / දෙවන කණ්ඩායම -2026 දෙසැම්බර් මස 01 වන දිනට )

| ඉල්ලුම්කරන කණ්ඩායම | පළමු කණ්ඩායම -2026 / දෙවන කණ්ඩායම -2026 |
|---|---|
| වයස | අවුරුදු : .............. මාස : .............. දින : .............. |

7. උස : සෙන්ටිමීටර්....................(අඩි......... අඟල් ...........)

8. පපුව : අඟල් ..................... (පිරිමි)

9. බර : කිලෝග්‍රෑම් .....................

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ..........................................................................................................

11. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර : ...................................................................................................

12. දිස්ත්‍රික්කය : ..........................................................................

13. ඡන්ද කොට්ඨාසය : ...................................................................

14. ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය : ............................................................................................................

15. දූරකථන අංක : .................................................... WhatsApp අංක : ..........................................................................
විද්‍යුත් ලිපිනය : ..................................................................................

16. විවාහක හෝ අවිවාහක බව : ...................................................................

17. ස්ත්‍රී පුරුෂ භාවය : ...................................................................

18. අධ්‍යාපනය ලැබූ පාසැල් : ප්‍රාථමික ................................................................................................................
ද්විතීක ................................................................................................................

19. පාසැල් සහ/ හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :-

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයන් (ශ්‍රේණි ඇතුලුව)* | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයන් (ශ්‍රේණි ඇතුලුව) | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | අ.පො.ස. (උ.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | විශ්වවිද්‍යාල/ වෙනත් සුදුසුකම් | | | |
| | | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් : ........................................................................................................................................

21. පාසැලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

22. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | වර්තමාන ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා :- | | | | |
| මව :- | | | | |
| සහෝදර සහෝදරියන්ගේ :- | | | | |
| | | | | |
| | | | | |

23. ඔබගේ ලේ ඥාතීන් කවරෙකු හෝ මින් පෙර සන්නද්ධ සේවයේ නියුතුව සිටියේ නම් ඒ පිළිබඳව විස්තර :
(දැනට සේවයෙන් නියුතු නම් ඒ පිළිබඳවත්, සේවයෙන් ඉවත්ව ගොස් ඇත්නම් ඉවත් වූ අකාරය සඳහන් කරන්න. නිතීමය ගැටළු ද ඇතුලත්ව සඳහන් කරන්න)

| නිලය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |

24. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර :- (ඔබ සහභාගි වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා)

| *අනු අංක* | *විස්තරය* | *පාසල්* | *පලාත්* | *ජාතික* | *අන්තර්ජාතික* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

25. පාසැලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධාන වලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමඟ විස්තර දක්වන්න.) :
.............................................................................................................................................................

26. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :
.............................................................................................................................................................

27. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලුම්කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. : .............................................
.............................................................................................................................................................

28. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ................................
.............................................................................................................................................................

29. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු : ...............
.............................................................................................................................................................

30. චරිත සහතික පිළිබඳ විස්තර :-

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

31. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :-

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්භට/ගුවන්කාන්තාවන් සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා එයට අදාළ වන ව්‍යවස්ථාද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය :- ........................................ .................................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

32. ඉල්ලුම්කරුගේ මව / පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(අ) ඉහත අයදුම්පතේ 31 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ........................................................................................................... නැමැති අපේක්ෂකයාගේ මව / පියා / භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී ඉහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියළුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම / ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු / ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියළුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

.......................................................................,
දෙමව්පිය / භාරකරුගේ අත්සන.

දිනය : ...............................................
නම : ..............................................................................................................................................................
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය : ..........................................................................................................................................................

.....................................................................,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : ...............................................
නම : ..............................................................................................................................................................
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය : ..........................................................................................................................................................

.................................................................,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : ...............................................
නම : ..............................................................................................................................................................
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය : ..........................................................................................................................................................

06 - 237/3

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ පවතින පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු 01 ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**2. අවශ්‍ය සුදුසුකම් :**

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.(සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.);

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුන (03) කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම; (ලේකම්/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානි විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතු ය.)

*සටහන :* මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය. සේවා කාලය ආරම්භවන හා අවසාන වන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක්වන තනතුරු ය.

**(iii) කායික යෝග්‍යතාව :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**(iv) වෙනත් සුදුසුකම් :**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

(v) අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**4. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

**5. වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු: 82150-10×2400-8×2940-17×3900-195970/- (SL-1-2025) වේ.

**6. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | |
| | (*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය; | 25 | |
| | (*ආ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක්; | 20 | |
| | (*ඇ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත්, | | **25** |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය, | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය, | 10 | |
| | • පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය, | 07 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය. | 05 | |
| | (*ඈ*) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| | *සටහන I :* නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ. | | |
| | *සටහන II :* ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>02</td><td>
අතිරේක පළපුරුද්ද :<br><br>
නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම.<br><br>
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table><br>
සටහන -<br>
ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන්වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.
</td><td></td><td>35</td></tr>
<tr><td rowspan="6">03</td><td>තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම</td><td></td><td rowspan="6">10</td></tr>
<tr><td>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම.</td><td>10</td></tr>
<tr><td>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්.</td><td>08</td></tr>
<tr><td>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්.</td><td>05</td></tr>
<tr><td>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබා ගත් සහතික පත්‍ර.(එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)</td><td>04</td></tr>
<tr><td>සටහන : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.</td><td></td></tr>
</table>

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 04 | **භාෂා හැකියාව :**<br><br>(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය.<br><br>(*ආ*) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරඟවලදී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><br><u>කේවල</u><br><br>(i) ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 12<br>(ii) දෙවන ස්ථානය - 10<br>(iii) තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><br><u>කණ්ඩායම්</u><br><br>(i) ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 10<br>(ii) දෙවන ස්ථානය - 08<br>(iii) තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 06<br><br>(*ඇ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්.<br><br>(*ඈ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී හෝ Edexel හෝ Cambridge උසස්පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 02 ක් ඇතුළත IELTS සමස්ත ලකුණු 6.5 (සෑම විෂයකටම අවම ලකුණු 06 ක් සහිතව) හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ ලබා තිබීම.<br><br>(*ඉ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතිකපත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්.<br><br>***සටහන :*** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | 15<br><br>12<br><br><br><br><br><br>10<br><br><br><br><br><br>08<br><br><br><br>05 | **15** |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය<br><br>තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ :<br><br>○ ශක්තීන් (Strength questions) (ලකුණු 02)<br>○ අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා<br>○ දක්ෂතාව (Competency questions) (ලකුණු 10)<br><br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබා දෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | 15 |
| | **එකතුව** | | **100** |

7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

**යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.**

**සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

**සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.**

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :

(i) අයදුම්පත් 2026.07.20 වැනි දිනට හෝ ඊට ප්‍රථම "කොමසාරිස් ජනරාල්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත් දෙවැනි පිටුව 06 සිට 09 දක්වාත් තෙවැනි පිටුව 10 සිට 12 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු.82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

9. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය.
2026 ජූනි මස 09 දින

**ආදර්ශ අයදුම්පත්‍රය**

*පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2026*

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

| | |
|---|---|
| සම්මුඛ පරීක්ෂණයට<br>පෙනී සිටින භාෂා මාධ්‍යය | |

(අදාළ අංකය කොටුව තුල ලියන්න. සිංහල -2 /දෙමළ -3/ ඉංග්‍රීසි -4)

*සටහන :-* අයදුම් කරනු ලබන මාධ්‍ය පසුව වෙනස් කළ නොහැක.

(1) 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..............................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..............................................................................................

1.2 සම්පූර්ණ නම : ..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................................................................................

1.3 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා: GUNAWARDHANA. M.G.B.S.K.

1.4 මුලකුරු සමඟ නම : ..............................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

(2) සම්පූර්ණ ලිපිනය:

2.1 ස්ථිර පදිංචි ලිපිනය : ..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................................................................................

2.2 ස්ථිර පදිංචි ලිපිනය : ..............................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..............................................................................................

2.3 සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය: ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 දුරකථන අංකය : ....................................................................

(3) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී -1 ☐ (අදාළ කොටුව තුල ලියන්න)
පුරුෂ - 0

(4) විවාහක/අවිවාහක බව : විවාහක - 1 (අදාළ කොටුව තුල ලියන්න)
අවිවාහක - 2 ☐

(5) 5.1 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

5.2 අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

5.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(6) සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තරය :

| *සුදුසුකම* | *ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|---|
| …………………….. | ................………… | ……………........ |
| ……………………...... | .........………………. | ………………… |

(7) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය: ......................................

(8) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :

| *සුදුසුකම* | *ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය / කාල සීමාව* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | |
| I …………………………….. | …………………………….. | ……………….. |
| II …………………………….. | ……………………………... | ……………….. |
| 2. අතිරේක පළපුරුද්ද : | | |
| I …………………………….. | …………………………….. | ……………….. |
| II …………………………….. | ……………………………... | ……………….. |
| 3. තොරතුරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම : | | |
| I …………………………….. | …………………………….. | ...…………….. |
| II …………………………….. | ……………………………... | ...…………….. |
| 4. භාෂා හැකියාව | | |
| I …………………………….. | …………………………….. | …………….. |
| II …………………………….. | ……………………………... | ....………….. |

(9) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? ......................................
("ඔව්" නම් විස්තර කරන්න)
..................................................................................................................................................

(10) අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත්, තොරතුරු බව සහතික කරන අතර, මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

............................ ...............................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

(11) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...............................................................මහතා/මහත්මිය/මෙනෙවිය මා දන්නා හඳුනන බවත්, අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

...................................................,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.
නම :
තනතුර :
දිනය :

(12) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය: (රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් සඳහා පමණි.)

ඉහත විස්තර සඳහන් ..........................................................................මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

...................................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

06 - 246

---

**විගණන සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ විශේෂ ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2026

ජාතික විගණන කාර්යාලයේ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ විශේෂ ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරට සෘජු ධාරාව මත බඳවා ගැනීම සඳහා (පුරප්පාඩු සංඛ්‍යාව 01 කි) අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **බඳවා ගැනීමේ ක්‍රමය:-**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ටය 03 හි

සඳහන් පරිදි පහත නිර්ණායකයන්ට යටත්ව (අංක 5 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද | 40 |
| තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 05 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 |
| එකතුව | 100 |

සටහන:- බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම්** :- සෑම අයදුම්කරුවකුම අයදුම්පත් කැඳවන අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**I.** අධ්‍යාපන සුදුසුකම් :- ගණකාධිකරණය, විගණනය, වාණිජ්‍ය, රාජ්‍ය මූල්‍ය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය, නීතිය, ඉංජිනේරු විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය යන විෂයය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක්/ උපාධි පිරිනමන ආයතනයක් වෙතින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**II.** වෘත්තීය සුදුසුකම් :- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

**III.** පළපුරුද්ද:- බාහිර අයදුම්කරුවෙක් නම් - අදාළ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර දොළහක (12) සේවා පළපුරුද්දක් ලබා තිබීම

*හෝ*

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නියුතු අයදුම්කරුවකු නම් විධායක මට්ටමේ තනතුරක වසර දොළහක (12) සේවා පළපුරුද්දක් ලබා තිබීම.
(මේ සම්බන්ධයෙන් සේවා කාලය ගණන් ගැනීමේ දී පූර්ණ වැටුප් සහිත, අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු සැලකිල්ලට ගනු නොලැබේ.)

IV. **ශාරීරික යෝග්‍යතාව**:- ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

V. වෙනත් සුදුසුකම්:-
(i). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
(ii). විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
(iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම.
(iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

VI. **වයස:- 2026 ජූලි 20** දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1981.07.20 දින සිට එම දින ද ඇතුළත් ව උපන් දිනය යෙදෙන අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.
(රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි :-**

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii). මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් වසරක පරිවාස කාලයකට යටත්වේ. එසේ වුවද එම නිලධරයාගේ පූර්ව සේවා කාලය හා පළපුරුද්ද නව තනතුරට අයත් සුදුසුකමක් නොවන කල්හි අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii). 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v). ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. **වැටුප් පරිමාණය** :- 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 165,700- 12 x 4,850 - රු. 223,900/- වේ. ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AS 04 - 2025 වන අතර 2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ උපලේඛන III අනුවය. මෙයට අමතරව තනතුරට අදාළ වන පරිදි රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| *අනු. අං.* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| I | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | 25 |
| | (අ) **සාමාන්‍ය උපාධිය** | 10 | |
| | (ආ) **විශේෂ උපාධිය** | 11 | |
| | (ඇ) **2 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය** | 11 | |
| | (ඈ) **2 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 13 | |
| | (ඉ) **1 වැනි පන්තිය සහිත සමාන්‍ය උපාධිය** | 13 | |
| | (ඊ) **1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 15 | |
| | (උ) **පශ්චාත් උපාධි ඩිප්ලෝමාව** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 18 | |
| | (ඌ) **MA/MSC හෝ ඒ හා සමාන වෙනත් උපාධියක්** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 20 | |
| | (එ) **ඉහත (ඌ) හි සඳහන් උපාධියකට වඩා ඉහළ උපාධිය** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 25 | |

| අනු. අං. | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| II | **අතිරේක වෘත්තීය සුදුසුකම්**<br>(මූලික වෘත්තීය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | | 20 |
| | (අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 07 | |
| | (ආ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II /අන්තර්මාධ්‍ය පරීක්ෂණය /ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය සමත් වීම | 09 | |
| | (ඇ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය / වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම | 12 | |
| | (ඈ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්ව | 15 | |
| | (ඉ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය | 20 | |
| III | **තොරතුරු තාක්ෂණය / පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම්**<br>විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන මාස 6ක හෝ ඊට වැඩි කාලයක පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම. | 05 | 05 |

ඉහත සටහනට අමතරව තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා (මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති වසර 12ට අමතරව) වසරකට ලකුණු 05 බැගින් **උපරිම ලකුණු 40** ක්ද, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා **උපරිම ලකුණු 10 ක්** ද වෙන්කර ඇත. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

6. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-**

(i). අයදුම්පත් **"ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව, අංක 415, කෝට්ටේ පාර, රාජගිරිය"** යන ලිපිනය සඳහන් කර **2026 ජූලි 20** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii). ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට අංක 08 දක්වාත් තෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් වන ආකාරයට පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii). අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"සෘජු ධාරාව මත නියෝජ්‍ය විගණකාධිපති තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iv). අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන විධායක ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v). අයදුම්පතක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(vi). විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණන සේවා කොමිෂන් සභා ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි රටට නැතහොත් ආසන්නම රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(vii). වෛද්‍ය පරීක්ෂණ සඳහා යානාපත්‍ර - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙක් වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු ය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානාපත්‍ර වියදමත් එම අයදුම්කරු විසින් ම දැරිය යුතු ය.

(viii). රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම කාර්යාලයේ කිසිදු නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතු ය.

(ix). මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(x). අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

(a) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත,
(b) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත,
(සැ.යු :- බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.),
(c) සාමාන්‍ය උපාධිය සහ එයට ඉහළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්),
(d) ප්‍රධාන වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ 2. II පරිදි) සහ අතිරේක වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්) සනාථ කෙරෙන සහතිකවල පිටපත්,
(e) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්,
(f) තොරතුරු තාක්ෂණය හා පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්),
(g) චරිතය පිළිබඳව සඳහන් වන මෑතකදී ලබාගත් සහතික දෙකක්,
(දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාළ නොවේ.).

***සටහන* -** සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතිකවල පිටපත් සනාථකර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

8. **සාවද්‍ය තොරතුරු සැපයීම:-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හා නොපිරවීමේ අයිතිය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඩී.කේ.විජේසිංහ,**
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

2026 ජුනි මස 19 දින,
අංක 415, කෝට්ටේ පාර,
රාජගිරිය.
විගණන සේවා කොමිෂන් සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ විශේෂ ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2026*

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යය සහ අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල-2 / දෙමළ- 3/ ඉංග්‍රීසි-4

සටහන:අයදුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

---

01. (i) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : .......................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම: ………………………………………………….
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම: ……………………..…………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදා :* GUNAWARDHANA, M.G.B.S.K.

02. (i) ස්ථිර ලිපිනය : …………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) දුරකථන අංකය: ස්ථාවර | | | | | | | | | | |

ජංගම | | | | | | | | | | |

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය: ................................
(ii) විවාහක / අවිවාහක බව: ................................

04. (i) උපන් දිනය :
වර්ෂය: ............. මාසය : ............ දිනය : .............

(ii) 2026 ජූලි 20 දිනට වයස:
අවුරුදු : ............ මාස : ......... දින : .........

(iii) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන වග?
................................

(iv) ජාතිය: .......................................

(v) ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

05. (i) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම්:

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| | | |
| | | |

(ii) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම්:

| සුදුසුකම | වර්ෂය | ආයතනය |
|---|---|---|
| | | |
| | | |

(iii) මෙම තනතුරට අයදුම් කිරීම සඳහා ලබාගෙන ඇති ක්ෂේත්‍ර පළපුරුද්ද:

| තනතුර | ආයතනය | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |

(iv) භාෂා ප්‍රවීණතාවය :
සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(i) තනතුර : ....................................................
(ii) දෙපාර්තමේන්තුව/ ආයතනය : .......................................................
(iii) පත් වූ දිනය : ................................................

(iv) ස්ථිරද, විශ්‍රාම වැටුප් සහිතද, තාවකාලිකද, නැතහොත් කොන්ත්‍රාත් පදනම මතද යන වග: ……………............... .....................................................................

(v) වාර්ෂික වැටුප් පරිමාණය: ……………………………………………………

(vi) දැනට ලබන වාර්ෂික වැටුප: ……………………………………

07. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය, තනතුර/රැකියාව සහ දුරකථන අංකය සඳහන් කරන්න.

(i) …………………………………………………………
…………………………………………………………

(ii) …………………………………………………………
…………………………………………………………

08. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

................................,
දිනය : ……………… අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ………………………………………………………… මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2026 ........... මස ............ වැනි දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

…………………….,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ………………………
ස්ථානය : ……………………………….
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නිරත නම්, ඔහු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ………………………………………………….. නමැති අයදුම්කරු / අයදුම්කාරිය …………………… දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවත්, අයදුම්කරු / අයදුම්කාරිය සේවයේ ස්ථිර කර ඇති /නැති බවත්, ඉහත 05 හි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ................. දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

........................................................,
දිනය:.............................. රාජ්‍ය /පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ බලයලත් නිලධාරියාගේ අත්සන.

06 - 250

**ආරක්ෂක අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරේ ස්වභාවය ;

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තවද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට අදාළ අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතුය. බඳවා ගනු ලබන්නේ කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරට ය.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.40,000-10x450-10x490-10x540-12x590-රු.61,880/- (PL – 1 - 2025 ) වේ. (රා.ප.ච 10/2025 හි උපලේඛන III හි විධිවිධාන අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.) බඳවා ගනු ලබන දින සිට වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය. (පත්වීමේ දින සිට වසර තුනක (03) යටත් වන අතර සුදුසුකම් සම්පූර්ණ කළ පසු තනතුරේ ස්ථිර කරනු ලැබේ.)

III. පැවරෙන රාජකාරි ;

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම, කාර්යාල භූමිය පිරිසිදු කිරීම හා නඩත්තු කටයුතුවලට සහාය වීම, කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කරන උපකරණ කොටුව පිරිසිදු කිරීම සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාම.

(ආ) කාලගුණ විද්‍යා උපකරණ පිරිසිදු කිරීම් කටයුතු, නඩත්තු කිරීම්වලට සහාය වීම. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයන්හි කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතුවලට සහාය වීම.

(ඇ) රාත්‍රී කාලයේ ප්‍රාදේශීය කාර්යාලවල උපකරණ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම

IV. සේවා මුර ක්‍රමයට රාජකාරියේ යොදවනු ලබන අතර රාත්‍රී සේවා මුරයන්වල ද රාජකාරි ඉටු කළ යුතු වේ.

03. සුදුසුකම් ;

මූලික සුදුසුකම් ;

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන **2026.07.20 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45** ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුතු මේ වන විට සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
IV. අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)

කායික සුදුසුකම් ;

V. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. බඳවාගැනීමෙන් පසු පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයේ දී සේවය සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවය නොමැති බව තහවුරු වුවහොත් තනතුරට නුසුදුසු සේ සලකා සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

VI. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් **2026.07.20** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

04. මෙයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් **2026.07.20 දින ප.ව 4.15** ට පෙර ලැබෙන සේ කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, අංක 383, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන් පමණක්** එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " **කාලගුණ විද්‍යා සහායකයින් බඳවාගැනීම සඳහා අයදුම්පත්** " යන්න පැහැදිලිව සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කවර හේතුවක් නිසා හෝ ක්‍රියා නොකරනු ලබන අතර, දැනට

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

05. භාෂා ප්‍රවීණතාවය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. අදාළ මට්ටමේ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් නතර කරනු ඇත.

06. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛන වල පැහැදිලි ඡායා පිටපතක් ස්වකීය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. (මුල් පිටපත් නොවේ.)

I. උප්පැන්න සහතිකයේ පිටපතක්;
II. ජාතික හැඳුනුම්පතේ පිටපතක් ;
III. අධ්‍යාපන සුදුසුකම් සහ පුහුණුව (ලබා තිබේ නම්) සනාථ කිරීම සඳහා වූ සහතිකවල පිටපත් ;
IV. සේවා පළපුරුද්ද සම්බන්ධව සහතිකවල (තිබේ නම් පමණක්) පිටපත් ;
V. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි හා චරිතය පිළිබඳ සහතිකය (මාස 06 ක් තුළ ලබාගත්);
VI. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්.

07. සම්මුඛ පරීක්ෂණයකට කැඳවූ අවස්ථාවේ හා පත්වීම් බලධාරියා ඉල්ලීම් කරන ඕනෑම අවස්ථාවක සහතිකපත් වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු ය.

08. මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

09. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**සටහන :** සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

**ඒ. එල්. කේ. විජේමාන්නගේ,**
කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (ආවරණ).
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2026 ජූනි මස 15 දින,
කොළඹ - 07,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*

01. මුලකුරු සමඟ නම - ( සිංහල / දෙමළ)
..........................................................................................................................................

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් - ( සිංහල / දෙමළ)
..........................................................................................................................................
..........................................................................................................................................

03. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) - (උදා : PERERA A.B.C)
..........................................................................................................................................
..........................................................................................................................................

04. ස්ථිර පදිංචි ලිපිනය -
..........................................................................................................................................
..........................................................................................................................................

05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය -
..........................................................................................................................................

06. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසියෙන් )
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

07. උපන් දිනය - .................................... 08. 2026.07.27 දිනට වයස - ......................................

09 .ස්ත්‍රී / පුරුෂ භාවය - ..........................................

10. ජාතික හැඳුනුම්පත් අංකය - ........................................................

11. විවාහක / අවිවාහක බව - ......................................................

12. දුරකථන අංකය - ............................................

13. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් -

අ.පො.ස (සා.පෙළ)

I. පළමුවර පෙනී සිටීම
වර්ෂය - ........................ විභාග අංකය..................................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

II. දෙවනවර පෙනී සිටීම
වර්ෂය - ........................ විභාග අංකය..................................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

III. අ.පො.ස (උ.පෙළ)
වර්ෂය - ........................ විභාග අංකය..................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

14. ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තරය -

| අනු අංකය | ආයතනය | පළපුරුද්ද සහතික කරන ලේඛනවල ඡායා පිටපත් |
|---|---|---|
| 1 | | අමුණා ඇත / අමුණා නැත |
| 2 | | අමුණා ඇත / අමුණා නැත |
| 3 | | අමුණා ඇත / අමුණා නැත |
| 4 | | අමුණා ඇත / අමුණා නැත |

15. ලබා ඇති පුහුණුව පිළිබඳ විස්තරය -

| අනු අංකය | ලබා ඇති පුහුණුව | ආයතනය | කාල සීමාව | පළපුරුද්ද සහතික කරන ලේඛන වල ඡායා පිටපත් |
|---|---|---|---|---|
| 1 | | | | අමුණා ඇත / අමුණා නැත |
| 2 | | | | අමුණා ඇත / අමුණා නැත |
| 3 | | | | අමුණා ඇත / අමුණා නැත |
| 4 | | | | අමුණා ඇත / අමුණා නැත |

16. අතිරේක අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර -

| අනු අංකය | සුදුසුකම් | සුදුසුකම් සහතික කරන ලේඛනවල ඡායා පිටපත් |
|---|---|---|
| 1 | | අමුණා ඇත / අමුණා නැත |
| 2 | | අමුණා ඇත / අමුණා නැත |
| 3 | | අමුණා ඇත / අමුණා නැත |
| 4 | | අමුණා ඇත / අමුණා නැත |

17. අයදුම්කරුගේ සහතිකය -

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය හා වැරදි බව මා තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් කිසිදු කොන්දේසියකින් තොරව සේවය අවසන් කිරීමට යටත් වන බවත් මම දනිමි.

මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, පුරප්පාඩු පවතින දිවයිනේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට ද කැමැත්ත ප්‍රකාශ කරමි.

දිනය -.......................... ..............................,
අත්සන.

18. දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතු ය -

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..............................................මයා/මිය/මෙනවිය ...................................................
අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ / කාර්යාලයේ .............................දින සිට ...........................................
තනතුරේ සේවය කරන බවත් ඔහු / ඇය සේවයේ ස්ථිර කර ඇති / නැති බවත්. සේවා කාලය තුළ විනය කරුණක් සඳහා වරදකරු වී ඇති / නැති බවත් මෙහි සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදි බවත් ඔහු / ඇය මෙම තනතුරට තෝරා ගනු ලැබුව හොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් කාරුණිකව දන්වමි.

සහතික කරන අයගේ නම :

තනතුර :

ලිපිනය :

(නිල මුද්‍රව තබන්න)

............................ ................................................,
දිනය අත්සන.

06 - 324

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**
**කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව**

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරි III ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 සැප්තැම්බර් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති " Online Applications Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.07.20** දින වේ.

**සටහන - මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.06.22 වන දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර 2026.07.20 දින ප.ව. 9.00 ට අවසන් වේ.**

02. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, ලිඛිත විභාගය සමත් මුළු ලකුණුවල කුසලතාවේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව 24කි.

03. (අ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්කිරීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්කිරීම් බලධරයාට බලය ඇත.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/07-01-18/01/2024 හා 2025.10.10 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පටිපාටියට මින්මතු කර ඇති හෝ කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඉ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

(ඊ) පත්වීමක් සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවා අවශ්‍යතාව පරිදි සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිර වුව ද රාජකාරි කළ යුතු අතර සේවා අවශ්‍යතාව මත සිදුකරන ක්ෂණික දැනුම්දීමකින් අඛණ්ඩව දින කිහිපයක් වුව ද බැහැරගතව පවත්නා පහසුකම් යටතේ රාජකාරි කිරීමට යටත් වන බව ද සැළකිය යුතු වේ.

04. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 04-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය : රු. 53,060-10 × 800-11 × 1,190-10 × 1,320-5 × 1,350– රු.94,100/-ක් වේ. පත්වීමක් සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවකුට එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

06. මෙම තනතුරට අදාළ කාර්යයන් :

- කුරුඳු සම්බන්ධ පර්යේෂණ සැලසුම් කිරීම, දත්ත එක් රැස් කිරීම, විශ්ලේෂණය, පර්යේෂණ පත්‍රිකා සැකසීම හා ඉදිරිපත් කිරීමට සහාය විම.
- විද්‍යාගාර හා ක්ෂේත්‍ර මට්ටමේ පරීක්ෂණ සේවාවන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම.
- පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම.
- කුරුඳු ක්ෂේත්‍රයට අදාළ දත්ත පද්ධති පවත්වා ගෙන යාම .
- සහතිකකරණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා ක්ෂේත්‍ර විගණන සඳහා සහාය වීම.
- කුරුඳු කර්මාන්තයට සම්බන්ධ පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීම සඳහා සහාය වීම.
- ව්‍යාපාර උපදේශන කටයුතු සඳහා සහාය වීම.
- අවස්ථාවෝචිත පරිදි මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික සහ වෙනත් වාර්තා අධීක්ෂණ නිලධාරි වෙත ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ සංවර්ධන සහාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම.
- අධීක්ෂණ නිලධාරියා විසින් අවස්ථාවෝචිත පරිදි පවරනු ලබන වෙනත් රාජකාරි ඉටුකිරීම.

07. සුදුසුකම් :

7.1 අධ්‍යාපන සුදුසුකම් :

කෘෂිකර්ම, ජෛවීය / ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, හරිත තාක්ෂණය, අපනයන කෘෂිකර්මය හෝ වැවිලි කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ,

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන (සිව් අවුරුදු) ගෞරව උපාධියක්;

*හෝ*

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ (සිව් අවුරුදු) ගෞරව උපාධියක්;

*හෝ*

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් (සිව් අවුරුදු) ගෞරව උපාධියක්;

*හෝ*

ලබා තිබීම.

7.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතු ය.

7.3 වෙනත් සුදුසුකම් :

(*අ*) ශ්‍රී ලංකා පුරවැසියකු වීම.
(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. ( ඒ අනුව 2005.07.20 දින හෝ ඊට පෙර හා 1991.07.20 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)
(*ඇ*) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

***සැළකිය යුතු යි* - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.07.20 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

08. විභාග පටිපාටිය :

(*අ*) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට කැමති අදාළ එක් මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| *අනු අංකය* | *විෂයයන්* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01 | අභියෝග්‍යතාව | 100 | පැය 01 |
| 02 | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 100 | පැය 02 |

(I) අභියෝග්‍යතාව :

අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතු ඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම හා උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ ප්‍රශ්න පත්‍රයක් ලබා දෙන අතර, ප්‍රශ්න පත්‍රය සඳහා වන මුළු ලකුණු 100න් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40ක් හෝ 40ට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු වේ.

(II) පොදු පරීක්ෂණය :
(තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)

(i.) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය -

- දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මයේ දායකත්වය
- රැකියා නියුක්තිය
- ගොවි ජනතාවට සේවාවන් සපයන විවිධ ආයතන

(ii.) වැවිලි භෝග වගාව -

- වැවිලි භෝග වගාව පිළිබඳ පොදු දැනුම
- කුරුඳු වගාවේ ඉතිහාසය
- කුරුඳු භෝගයේ ව්‍යාප්තිය, සමස්ත නිෂ්පාදනය, වගා වපසරිය

(iii) ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප පිළිබඳ දැනුම

(iv) පස හා ශාක පෝෂණය -

- පසේ භෞතික හා රසායනික ලක්ෂණ
- ශාක පෝෂණ පිළිබඳ දැනුම
- ශාක රෝග කාරක හා පළිබෝධ පිළිබඳ දැනුම
- කෘෂි රසායනික පිළිබඳ අවබෝධය
- ශ්‍රී ලංකාවේ පස් කාණ්ඩ පිළිබඳ සරල අවබෝධය

(v.) කෘෂිකර්ම ව්‍යාප්තිය :

- කෘෂිකර්ම ව්‍යාප්තිය හා සන්නිවේදන ක්‍රම

(vi.) නවීන කෘෂි තාක්ෂණය, කෘෂිකාර්මික නවීන තාක්ෂණික ක්‍රම :

- ජාන තාක්ෂණය
- නැනෝ තාක්ෂණය
- හරිතාගාර තාක්ෂණ,
- ගෝලීය ස්ථාන නිර්ණයන පද්ධති තාක්ෂණය (GPS - Global Positioning System)
- ඩ්‍රෝන තාක්ෂණය
- දේශගුණික විපර්යාස අවම කිරීම හා අනුවර්තනය
- සුහුරු කෘෂිකර්මය (Smart Agriculture)

(vii.) ශාක කායික විද්‍යාව :

- ශාක ප්‍රභාසංස්ලේෂණය
- උත්ස්වේදනය
- ශ්වසනය
- ශාක ජල සබඳතාව

පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම ව්‍යුහගත රචනා මාදිලියේ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න පත්‍රයක් ලබා දෙන අතර, ප්‍රශ්න පත්‍රය සඳහා වන මුළු ලකුණු 100න් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40ක් හෝ 40ට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු වේ.

***සටහන* - රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.**

(III) විභාග ප්‍රතිඵල - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය ලද පසුව ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/ මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

09. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත පරීක්ෂණයෙන් සමත් වීම සඳහා ඉහත ප්‍රශ්න පත්‍ර දෙකෙන් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40 ක් හෝ 40 ට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු වේ. ඒ අනුව ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

(i). ලිඛිත පරීක්ෂණය සඳහා වන විෂයයන් දෙකෙහි අවම සමත් ලකුණ ඉක්මවූ සහ විෂයයන් දෙක සඳහාම වන මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii). සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - අයදුම්කරුවන් පත්වීමක් ලැබීම සඳහා නිවේදනයේ 07 වගන්තිය අනුව සුදුසුකම් සපුරා තිබේ ද පරීක්ෂා කිරීම ද,

අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්වල සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කර බැලීම ද,

ක්ෂේත්‍ර රාජකාරී සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම ද,

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලබයි.

(iii). සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සමත් අයදුම්කරුවන් පමණක් පත්වීමක් සඳහා තෝරාගනු ලැබේ.

(iv). සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

10. පත්වීමක් සඳහා තෝරා ගැනීම :

නිවේදනයේ 02 වගන්තියේ සඳහන් කර ඇති පුරප්පාඩු ගණනට අදාළව ලිඛිත පරීක්ෂණයේ ලකුණු අනුව අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් කුසලතා අනුපිළිවෙළට සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා

එමගින් සමත්වන අයදුම්කරුවන් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට පත්වීමක් සඳහා තෝරා ගනු ඇත.

ලිඛිත විභාගයක ප්‍රතිඵල මත පමණක් පදනම්ව සිදු කෙරෙන බඳවා ගැනීම්වලදී ප්‍රසිද්ධ කරන ලද පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ගණනක් සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් සිටින අවස්ථාවලදී තෝරාගැනීමක් සිදු කිරීම සඳහා අනුගමනය කළ යුතු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරා ගැනීමේ පටිපාටිය පහත පරිදි වේ.

කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්ත ය.

I. අපේක්ෂකයන්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
II. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පැවැත්වෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබයි.

මෙම තෝරාගැනීමේ පටිපාටියේ ව්‍යුහය හා අන්තර්ගතය පිළිබඳ වැඩිදුර තොරතුරු www.psc.gov.lk හි රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පළ කර ඇත.

මුල් පිටුව → බාගත කිරීම් → ක්‍රියා පටිපාටි → විශේෂ තෝරාගැනීමේ පටිපාටිය

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

(i). අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ii). අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතා කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

12. විභාග කොන්දේසි :

(i). මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු ය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර, කියවා අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපැදිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii). විභාග ගාස්තු රු 600/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය හෝ “Flex” යෙදවුම මගින් (Bank of Ceylon Online Banking Method/ or Flex App)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

***සටහන* - ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.**

(iii). ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් (E-mail) මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(iv). විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(v). අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතු ය.

(vi). *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(vii). අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර, අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් ද දැනුවත් කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය.

එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii). ප්‍රවේශ පත්‍රය පරීක්ෂාකර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේදී හෝ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ix). විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(x). විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

13. විභාගයට ඇතුළත්කර ගැනීම :

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළ කර ඇත.

***සටහන* - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.**

14. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,

III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුලු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

15. දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

16. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

17. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

18. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

**එල්.එම්.ජේ.කේ. ලින්දර,**
අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*).

2026 ජුනි මස 09 වැනි දින,
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව,
ගුණරත්න වීරකෝන් මාවත,
බොරකන්ද, කරන්දෙණිය.

06 - 230

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ **විවෘත** තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ඔක්තෝබර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී** පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Application – Recruitment Exams/ E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026, ජුනි මස 22 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර 2026, ජූලි මස 20 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.**

❖ දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවයේ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**1.0 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුර :**

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01 | ඉංජිනේරු සහකාර | 102 | III වන ශ්‍රේණියට බඳවා ගැනේ. එහෙත් ඍජුව බඳවා ගන්නා නිලධාරීන් හට මුල් මාස 06 තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවාස්ථ පුහුණුවක් ලබාදෙනු ලැබේ. |

1.1 **තනතුරුවල රාජකාරි ස්වභාවය**

දෙපාර්තමේන්තු රෙගුලාසි අනුව වාරිමාර්ග ඉංජිනේරුවරයකුගේ අධීක්ෂණය යටතේ පවරනු ලබන,

- නව හෝ පවතින ගුරුත්ව / උත්සාන / ක්ෂුද්‍ර වාරිමාර්ග, ගංවතුර හා කරදිය වැලැක්වීමේ ව්‍යාපාරවල ඉදිකිරීම් / වැඩිදියුණු කිරීම් / පුනරුත්ථාපන / මෙහෙයුම් හා නඩත්තු සහ ජල පාලනය ඵලදායී ලෙස මෙහෙයවීමේ වැඩ සඳහා මූලික විමර්ශන, පූර්ණ විමර්ශනවලට අනුකූලව බිම්මැනුම් සහ මට්ටම් ගැනීම, සීමිත පරිමාණයේ සිවිල් ඉංජිනේරුමය නිර්මාණ සහ සැලසුම් පිළියෙල කිරීම, අදාළ පිඹුරුපත් පිළියෙල කිරීම, ප්‍රමාණ සමීක්ෂණය, මිල ගණන් විශ්ලේෂණය හා ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- සම්මත පිරිවිතර අනුව ප්‍රසම්පාදන ලිපිලේඛන පිළියෙල කිරීම, වැඩ අධීක්ෂණය, සංවිධානය තත්ත්ව පාලනය.
- ක්ෂේත්‍ර /වැඩබිම්වල යන්ත්‍රෝපකරණ, ඉන්ධන, ද්‍රව්‍ය හා ගබඩා කළමනාකරණය හා අදාළ ගණන්දීම.
- ක්ෂේත්‍ර /ඒකක භාර නිලධාරී, වාරිමාර්ග ව්‍යාපාරයන්හි ව්‍යාපාර කළමනාකරු ලෙස ආයතනික සංවිධාන සංවර්ධනය හා පුහුණු කිරීම, වැඩ පරිපාලකවරුන්ගේ /තාක්ෂණ සහායකවරුන්ගේ, ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ සහ කම්කරුවන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම.
- වාරිමාර්ග ආඥාපනත හා අනෙකුත් නීති පනත් මඟින් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන රාජකාරි සම්බන්ධයෙන් ක්ෂේත්‍ර කටයුතු සහ පවරනු ලබන අනෙකුත් ඉංජිනේරුමය උපවෘත්තික කාර්යයන් කිරීම.

**2.0 බඳවා ගැනීමේ ක්‍රමය :**

2.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාව හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

2.3 වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ මාර්ගගතව හෝ ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

2.4 ***සෘජු බඳවා ගැනීම***

i. සෘජු බඳවා ගැනීම් යටතේ බඳවා ගන්නා ලද ආධුනිකයන් හට න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් වන සේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන සය මසක (06) පුහුණුවකින් පසුව පවත්වන න්‍යායික හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වීමේ කුසලතාව මත ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලැබේ.

ii. මෙම ආධුනිකයින් ලබා ඇති එක් වසරක ක්ෂේත්‍ර පුහුණුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ සාර්ථකව ලබාගෙන ඇත්නම් බඳවා ගැනීමෙන් පසුව ආධුනිකයන් ලැබිය යුතු සය මසක (06) පුහුණු කාල සීමාවෙන් නිදහස් කරනු ලබන අතර, ඔවුන් සියලු දෙනාම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.

**3.0 වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.52,250-10X800-11X1,190-10X1,320-10X1,350-රු. 100,040/= වේ. (MN3-2025)

**4.0 සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර/ තාක්ෂණික :**

4.1 ***ශ්‍රේණි -*** III **ශ්‍රේණිය**
II ශ්‍රේණිය
I ශ්‍රේණිය
විශේෂ ශ්‍රේණිය

4.2 ***තනතුරෙහි ස්වභාවය :*** මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකරනු ලැබේ.

**5.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

5.1 සෘජු බඳවා ගැනීම් යටතේ බඳවා ගන්නා ආධුනිකයින් හට III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර විධිමත් පත්වීම් භාරගත් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාල සීමාව තුළ පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතු ය.

5.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුල ලබාගැනීම අනිවාර්ය වේ.

5.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්තිවල විධිවිධානවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීතිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

5.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතු ය.

**6.0 වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

**7.0 අවශ්‍ය සුදුසුකම් :**

7.1 ***අධ්‍යාපන සුදුසුකම් :***

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් විෂයන් එකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සමග*

පැරණි විෂයය නිර්දේශය අනුව භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය හා රසායනික විද්‍යාව යන ක්ෂේත්‍රයන්ට අදාළ විෂයන්ගෙන් එක් වරක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම;

*හෝ*

නව නිර්දේශය අනුව උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායනික විද්‍යාව යන විෂයයන් (03) කින් එකවරක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම.

7.2 ***වෘත්තීය සුදුසුකම් :***

I. ගල්ගමුව, කොත්මලේ වාරිමාර්ග අභ්‍යාස ආයතනයක වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

II. මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

III. මට්ටක්කුලිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

IV. කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

V. විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

VI. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉහත පාඨමාලාවන්ට සමාන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

මෙම පාඨමාලා NVQ 06 මට්ටමේ විය යුතු ය.

පාඨමාලාව සම්පූර්ණ කර ඇති එහෙත් සහතිකය ලබා නොමැති අයදුම්කරුවන්ට ද අයදුම් කළ හැකි අතර, ඔවුන් එකී සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නමුත් සහතිකයේ බලාත්මක දිනය ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර විය යුතු ය.

7.3 ***කායික සුදුසුකම් :***

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

7.4 ***වෙනත් සුදුසුකම් :***

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**8.0 විභාග පටිපාටිය :**

මෙම විභාගය බහුවරණ ප්‍රශ්න පත්‍රයකින් යුක්ත වන අතර සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

**8.1 විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන්, විශ්ලේෂණ හැකියාවන්, තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීමත් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

**9.0 අයදුම් කිරීමේ ක්‍රමය :**

9.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමුකරන ලද මෘදු පිටපත් හා වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-Mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක්

ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය යි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දෙනු නොලැබේ.

9.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් හා අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.4 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

9.5 ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.6 සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**10.0 විභාග ගාස්තු :**

❖ විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත සඳහන් ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය :-

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the facility of internet transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank Of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank Of Ceylon)ශ

*සටහන :*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

**11.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව:**

11.1 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ :-

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**12.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

12.1 අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

**13.0 පොදු කරුණු:**

13.1 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

13.2 පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක්, විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබේ.

13.3 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

13.4 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ආචාර්ය(ඉංජි). **කිත්සිරි වැලිගෙපොලගේ,**
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජූනි මස 11 දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

06 - 258

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

**විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026**

විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරෙහි පවත්නා පුරප්පාඩුව සඳහා පත්කිරීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා මෙම නිවේදනයේ ඇතුලත් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ "සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර" යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.07.10** දින වේ.

*සටහන :* ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳව සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර යොමු කිරීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි සියලුම හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. තවද මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

(i.) නිවේදනයේ ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවාගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 08 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii.) පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

(i.) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii.) තෝරාගනු ලබන අයදුම්කරු ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පත් කරනු ලැබේ.

(iii.) තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන්, 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවයක් ලබාගත යුතු වේ. ඔබගේ බඳවා ගැනීමේ මාධ්‍ය වනුයේ ඔබ විසින් උපාධිය සම්පූර්ණ කරන ලද මාධ්‍යය වේ. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක III මට්ටමේ ප්‍රවීණතාවයක් ලබාගත යුතු වේ.

(iv.) සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**03. වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.82,150– 10 x 2,400 – 8x 2,940 – 17 x 3,900 - රු. 195,970 (SL-1-2025) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ.

**04. අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම

**05. පළපුරුද්ද :**

I. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුන (03) කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු වෙතින් ලබාගත් සේවා සහතිකයක් අවශ්‍ය වේ. දැනට වෙනත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රජයේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචි අංකය ලිපි ශීර්ෂයේ සඳහන් කළ යුතු ය.) යන ආයතනයක සේවය කරනු ලබන අයෙකු නම් එහි ප්‍රධානී මඟින් එම පළපුරුද්ද සනාථ කළ ලිපියක් තිබීම අවශ්‍ය වේ. එසේ ඉදිරිපත් කරනු ලබන ලේඛනවල නිකුත් කළ දිනය, සේවය කළ කාලසීමාව සහ නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.);

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03ට නොඅඩු, පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.

(අ) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම;
(ආ) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු;
(ඇ) අදාළ අණපනත් සම්බන්ධ නෛතික කටයුතු ;
(ඈ) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු;
(ඉ) විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

**06. වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නිකුත් කළ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉදිරිපත් කළ යුතු ය).

**07. කායික සුදුසුකම් :**

(i.) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සනාථ කළ යුතු ය.

**08. වෙනත් සුදුසුකම් :**

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය. (ඒ බව අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරි වෙතින් මාස 06ක් තුළ ලබාගත් DS 04 සහතිකයකින් හා තවත් චරිත සහතිකයකින් සනාථ කළ යුතු ය.

(iii) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට්* පත්‍රයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9. සම්මුඛ පරීක්ෂණය :**

**යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණය** (ලකුණු ලබාදෙනු ලැබේ.)

| *පරීක්ෂාකර ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| **9.I අතිරේක අධ්‍යාපන සුදුසුකම්;**<br><br>9.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය ( ලකුණු 20)<br><br>9.1.2 රජය පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද නීති ක්ෂේත්‍රයට අදාළව ලබාගන්නා ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු ) (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 X 04 = ලකුණු 20)<br><br>9.1.3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද සිව් වසරක වෙනත් උපාධියක් සඳහා<br><br>9.1.3.1. පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා - ලකුණු 10<br>9.1.3.2 දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා - ලකුණු 07<br>9.1.3.2 දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා - ලකුණු 05<br><br>(උපරිම එක් සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 20 |

| *පරීක්ෂාකර ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| **9.2 අතිරේක වෘත්තීය සුදුසුකම්;**<br><br>9.2.1 රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන නීති ක්ෂේත්‍රයට අදාළ අවුරුද්දක් හෝ ඊට වැඩි ඩිප්ලෝමාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 බැගින් )<br><br>9.2.2 රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන නීති ක්ෂේත්‍රයට අදාළ මාස හයක් හෝ ඊට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින් )<br><br>9.2.3 රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන නීති ක්ෂේත්‍රයට අදාළ මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින් )<br>***සැ.යු :*** අංක 9.1 එක යටතේවන ලකුණු ලබා දුන් සහතික හැර වෙනත් සහතික සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ<br><br>9.2.4 පුද්ගලික අංශයේ / අර්ධ රාජ්‍ය අංශයේ සමාගම් ලේකම්වරයකු/වරියක ලෙස සේවයේ යෙදී සිටීම - සම්පූර්ණ වසරකට ලකුණු 03<br><br>9.2.5 නොතාරිස් ධුරයේ කටයුතු කිරීම- සම්පූර්ණ වසරකට ලකුණු 03<br><br>9.2.6 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ ලියාපදිංචි උසස් අධ්‍යාපන ආයතනයක දේශකවරයෙකු/බාහිර දේශකවරයෙක් ලෙස සේවයේ යෙදී සිටීම - සම්පූර්ණ වසරකට ලකුණු 03<br><br>9.2.7 රජයේ පිළිගත් විනිශ්චය සභාවක තනතුරක් /සාමාජිකයෙක් ලෙස ක්‍රියා කර තිබීම - සම්පූර්ණ වසරකට ලකුණු 03 | 15 |
| **9.3 අතිරේක පළපුරුද්ද ;**<br><br>9.3.1 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන වසර 03ක සේවා කාලය හැර (මුල් වසර 03ට අමතරව ලබාගෙන ඇති පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 05 බැගින්)<br><br>9.3.2 එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30ක්<br>9.3.3.මාස හයකට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br><br>(සක්‍රීය වෘත්තිය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු වෙතින් ලබාගත් සේවා සහතිකයක් අවශ්‍ය වේ. දැනට වෙනත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රජයේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචි අංකය ලිපි ශීර්ෂයේ සඳහන් කළ යුතු ය.) යන ආයතනයක සේවය කරනු ලබන අයෙකු නම් එහි ප්‍රධානී මඟින් එම පළපුරුද්ද සනාථ කළ ලිපියක් තිබීම අවශ්‍ය වේ. එසේ ඉදිරිපත් කරනු ලබන ලේඛනවල නිකුත් කළ දිනය, සේවය කළ කාලසීමාව සහ නිල මුද්‍රාව පැහැදිලිව සඳහන්කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.) | 30 |

| *පරීක්ෂාකර ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| **9.4** භාෂා හැකියාව<br><br>9.4.1 ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය / පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය / වෙනත් උපාධිය (ලකුණු 15)<br>(අදාළ භාෂා මාධ්‍යය විස්තරාත්මක ප්‍රතිඵල සටහනෙහි දක්වා තිබිය යුතු ය)<br><br>9.4.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වසර 01 / පැය 1500කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ( ලකුණු 10 )<br><br>9.4.3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව<br>මාස 06 / පැය 720යි. (ලකුණු 7)<br>මාස 03 / පැය 360 යි. (ලකුණු 5)<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 15 |
| 9.5 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම<br><br>9.5.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම<br>(ලකුණු 15)<br>9.5.2 රජය පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>9.5.2.1 මාස 06 / පැය 720 (ලකුණු 10 )<br>9.5.2.2 මාස 03/ පැය 360 යි ( ලකුණු 05 )<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 15 |
| 9.6 සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය<br><br>සාමාන්‍ය දැනීම හි බුද්ධිය<br>නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම<br>පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව හා පෞරුෂය | 05 |
| **එකතුව** | **100** |

*සටහන* - සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම් එවැනි සහතික පත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතන මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ.එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සඳහා සළකා බලනු නොලැබේ.

**10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ නිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් පමණි .

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා තමන් විසින්ම සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ඡායා පිටපත් ගොනු 02කින් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

01 . පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
02. වලංගු විදේශ බලපත්‍රය,
03. වලංගු රියදුරු බලපත්‍රය.

**11. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

I. අයදුම්පත් **2026.07.10** දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ 13,**
**ගැටඹේ,**
**පේරාදෙණිය.**

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.1 සිට 3.1 දක්වාත් දෙවැනි පිටුව 3.2 සිට 4.7 දක්වාත් තෙවැනි පිටුව 5 සිට 8 දක්වාත් වන ආකාරයෙන්ම පිළියෙල කර තමාගේ අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම** යනුවෙන් සඳහන් කළ යුතු ය.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු හෝ රු: 82,150.00 ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

V. දැනට රාජ්‍ය සේවයේ , පළාත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

VI. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VII. ආයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

**12. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

**13. වෙනත් විධිවිධාන :**

I. මෙම *ගැසට්* නිවේදනයේ විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

II. පුරප්පාඩුව පිරවීම හෝ නොපිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

III. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

IV. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

V. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති යම්කිසි කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම්
හා වාරිමාර්ග අමාත්‍යාංශය.

2026 ජුනි මස 10 වැනි දින,
කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත**

*කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීමේ අයදුම්පත*

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.

සිංහල -2/ දෙමළ-3/ ඉංග්‍රීසි -4 භාෂා මාධ්‍යය

| |
|---|
| |

සටහන - අයදුම් කරනු ලබන මාධ්‍ය වෙනස් කළ නොහැක.අයදුම් කරනු ලබන මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.

01. (i) සම්පූර්ණ නම :- (මයා/මිය/මෙය) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ii) සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

02. මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) :

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා:-

| | | | | |
|---|---|---|---|---|
| SILVA | | A | B | C |

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. (I) ස්ථිර ලිපිනය :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(II) තැපැල් ලිපිනය:

ඉංග්‍රීසියෙන්

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත්, වහාම ඒ බව දැනුම් දිය යුතු ය.)

05. ස්ථිර පදිංචි ස්ථානය අයත් :

(i) පළාත්පාලන ආයතනය : ……………………

(ii) දිස්ත්‍රික්කය : ……………………

06. දුරකතන අංකය : ස්ථාවර දුරකථන අංකය : □□□□□□□□□□

ජංගම දුරකථන අංකය : □□□□□□□□□□

07. උපන් දිනය : වර්ෂය : ...................... මාසය : ....................... දිනය : .......................

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු : .............. මාස : .............. දින : ..............

08. (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද යන බව : ........................

(ආ) ජාතිය (සිංහල/ ශ්‍රී ලංකා ද්‍රවිඩ/ ඉන්දියානු ද්‍රවිඩ/ මුස්ලිම්/ වෙනත්) : ............................

09. (අ) ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ 0

ස්ත්‍රී 1 □

(ආ) විවාහක/ අවිවාහක/ වැන්දඹුද යන වග : විවාහක - 1

අවිවාහක - 2 □

වැන්දඹු - 3

10. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දුන් දිනය:......................................................

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ මූලික සුදුසුකම් ලබා ගැනීමට අදාළ පහත සඳහන් ලේඛණවල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.

11.1 නීතිවේදී උපාධි සහතිකයේ / ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දුන් සහතිකයේ ඡායා පිටපත,

11.2 පළපුරුද්ද සනාථ කරන සහතිකවල ඡායා පිටපත්,

11.3 උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්,

11.4 වලංගු ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ බලපත්‍රය / වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක්.

12. ඔබ කෙදිනක හෝ අපරාධ චෝදනාවක් යටතේ දිවයිනේ කවර හෝ අධිකරණයක වරදකරු කරනු ලැබ තිබේද: ඔව් / නැත

13. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන

බවත්, මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධි වරදකට වැරදිකරුවෙකු වී නොමැති බවද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..................

14 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

............................................. ..................................................................,
දිනය සහතික අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :
තනතුර:
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

(දැනට රජයේ ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන්ට පමණක් අදාළ වේ)

15. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

ඉහත අයදුම්කරු වූ ............................. මහතා/ මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ................. පළාත් සභාවේ .............................. තනතුරක් දරන නිලධාරිවරයෙකු බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/ පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බවත් දන්වමි.
(අදාළ නොවන වචන කපා හරින්න)

.................................................,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය : ..........................
ලිපිනය : .......................

06 - 278

---

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සඳහා I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

1.0 ඉහත සඳහන් සේවයට අයත් නිලධාරීන් සඳහා අදාළ අංක 2444/21 හා 2025.07.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ තෙවන සංශෝධනය සහ අංක 2493/61 හා 2026.06.19 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සිව්වන සංශෝධනයේ විධිවිධානයන්ට අනුකූලව I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2026 සැප්තැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය උපලේඛනය I හි සඳහන් නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන ලද නගරය / නගර පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන්

සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද, යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doents.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති " Online Applications - Recruitment Exams /E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජුනි මස 23 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 ජූලි මස 17 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත් දෙකක් (02) ලබාගෙන එම පිටපත් දෙකෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය සමඟ ඉන් එක් පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතුය. අනෙක් පිටපත අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා තමන් භාරයේ තබා ගත යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

2.0

I. මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට්* පත්‍රයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනු ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ පළාත් රාජ්‍ය සේවාවල ගුරු සේවයේ පහත 12.0 මගින් දක්වන ලද නිලධාරින්ට පමණි.

IV. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.0 විභාග ගාස්තු:-

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාග පළමු වරට පවත්වනු ලබන බැවින් ගාස්තු අය කරනු නොලැබේ.

4.0 අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම:-

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E -mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

6.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති

අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.

විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.0 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ අදාළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.0 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතු ය.

9.0 විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවශ්‍ය පරිදි රාජකාරි නිවාඩු ලබා දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තම පත්වීම් විෂයයට අදාළ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ පළාත් රාජ්‍ය සේවාවල ගුරු සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට, 3 පන්තියේ I ශ්‍රේණියට හා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.8 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම මත 2-II ශ්‍රේණියට බඳවා ගත් ගුරුවරුන් අදාළ ශ්‍රේණියට පත්වී වසර තුනක් (3) ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ යුතු ය. එම නිලධාරින්ට අමතරව, මේ දක්වා I වන කාර්යක්ෂමතා කඩඉම් ඊළඟ උසස්වීමට පෙර සම්පූර්ණ කිරීමේ කොන්දේසිය මත උසස් වීම් ලබා ඇති ගුරු සේවයේ නිලධරයන් ද, එකී උසස්වීම් ලබා දීමේ දී දක්වන ලද පරිදි I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවශ්‍යතාව ද සම්පූර්ණ කළ යුතු වේ.

13.0 විභාග පරිපාටිය -

13.1 ප්‍රශ්න සැකැස්ම :

අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් e-thaksalawa නිල වෙබ් අඩවියේ පළ කරන ලද පහත 13.2 හි දක්වා ඇති ස්වයං අධ්‍යයන මොඩියුල සම්බන්ධ විෂය නිර්දේශය ආශ්‍රයෙන් සකස් වේ. මෙම කාර්යක්ෂමතා කඩඉම සඳහා වන ලිඛිත පරීක්ෂණය එම අදාළ මොඩියුල සියල්ලම ආවරණය වන සේ පහත පරිදි පැවැත් වේ.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| II පත්‍රය | ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න | පැය 02 | 60 |

***සටහන 1*** - I පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම I පත්‍රය නිකුත් කරන අතර එය බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර, II පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම II පත්‍රය නිකුත් කරන අතර එය අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් සමන්විතය. එම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම අන්තර්ගත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

13.2 විභාගය සඳහා විෂය නිර්දේශය

| *කාර්යක්ෂමතා කඩඉම* | *අදාළ වන මොඩියුල* | |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | 1. | ගුරු නිපුණතා රාමුව හා ගුරු වෘත්තිකභාවය |
| | 2. | ඉගැන්වීමේ ක්‍රමවේදය |
| | 3. | අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය |
| | 4. | අධ්‍යාපනයට අදාළ නීතිය |

*සටහන 2* - සාමර්ථ්‍යය සඳහා ඉහත 13.1 වගුව මගින් දක්වන ලද I පත්‍රයේ සහ II පත්‍රයේ ලකුණුවල මුළු එකතුව 40% ක් හෝ ඊට වැඩිවන සේ ලබා ගත යුතු ය.

14.0 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :- විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ :

I. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ (ජාතික හා පළාත්) ප්‍රතිඵල පළාත් අනුව වෙන් වෙන් වශයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පිටපත් දෙකක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබයි.

II. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන එකී විභාග ප්‍රතිඵල ලේඛන පිටපත් දෙකෙන් එක් පිටපතක්; ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන්ගේ විභාග ප්‍රතිඵල සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ.

III. එසේම, සියලුම ගුරු සේවයේ නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීමට හා ශ්‍රේණි උසස්වීම්වලට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුට ද බාගත කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. එසේ බාගත කර ගන්නා ප්‍රතිඵල ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම ප්‍රතිඵල ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සත්‍යාපනය කරගෙන අදාළ නිලධරයාගේ පුද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු ය.

IV. එකී සත්‍යාපනය කරන ලද ප්‍රතිඵල පදනම් කරගෙන පළාත්/කලාප අධ්‍යාපන බලධරයන් විසින් අදාළ ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා අදාළ කටයුතු කළ යුතු වේ.

V. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

15.0 මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේනම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 ජුනි මස 17 දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

**උපලේඛනය I**

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික් / නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

**වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - අතුරුගිරිය

**සහකාර වතු අධිකාරී පුහුණු පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, 1979 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මඟින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුබද්ධව ස්ථාපිත කොට ඇති අතර වැවිලි ක්ෂේත්‍රයෙහි නියුතු හා නියැලීමට උනන්දුවක් දක්වන පාර්ශ්ව සඳහා අධ්‍යයන සහ වෘත්තිය සුදුසුකම් ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් මෙරට තුළ ස්ථාපිත රජයේ එකම ආයතනය ද වේ.

2026/2027 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් පාඨමාලාව සඳහා උසස්පෙළ සමත් සිසුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**Advanced Certificate Course in Plantation Management (ACCPM) Planter Trainee Programme**
**(සහකාර වතු අධිකාරී පුහුණු පාඨමාලාව)**

| | | |
|---|---|---|
| **කාල සීමාව** | - | අවුරුදු එකකි (01)<br>අදියර I - මාස 06 ක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාව<br>අදියර II - මාස 06 ක වතු ආශ්‍රිත ප්‍රායෝගික පුහුණුව |
| **මාධ්‍යය** | - | ඉංග්‍රීසි |
| **පාඨමාලා ගාස්තුව** | - | අදියර I සඳහා රු. 400,000.00 |
| **වයස් සීමාව** | - | උපරිම වයස් සීමාව අවුරුදු 22 |

**<u>සුදුසුකම්</u>**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී දෙවතාවකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව යන විෂයයන් තුනට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක් (06) සමත් වීම;

*හා*

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම;

***හෝ***

අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ලබා තිබීම.

***අයදුම්කරන ආකාරය :***

සපයා ඇති ආකෘතිය අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සහිතව ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට 2026.06.26 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන පාඨමාලාව සඳහන් කළ යුතු ය. මෙම දැන්වීම **www.nipm.gov.lk** යන වෙබ් අඩවියේ ද පළ කොට ඇති අතර මාර්ගගතව ද අයදුම්පත් භාර ගනු ලැබේ.

අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි,
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය,
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.

වැඩිදුර විස්තර සඳහා
011-2770232
071-9708664

FM/TR/03

## NATIONAL INSTITUE OF PLANTATION MANAGEMENT

### APPLICATION FOR ADMISSION

**Name of the Programme :**

**Name in Full : Mr. /Mrs./ Miss./ Dr. / Prof. (Use BLOCK LETTERS) :**

**Name with initials :**

**Permanent Address :**

**Employer :**

**Designation :**

**Tele. No.**

**Mobile No.:**

**Official address :**

**E-mail:**

**National Identity card No.:**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**Tele. No.:**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**Marital Status**

**Single** ☐

**Married** ☐

**Date of Birth**

| Date | | Month | | Year | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**Fax No.:**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**EDUCATIONAL QUALIFICATIONS**

**G.C.E. (O/L) Examination**

| *Subject* | *Grade* | *Year* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

**G.C.E. (A/L) Examination**

| *Subject* | *Grade* | *Year* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**COURSE COMPLETED AT THE NIPM**

| *Course* | *Year* |
|---|---|
| | |
| | |
| | |

**PROFESSIONAL QUALIFICATIONS**

| *Institute* | *Period* | *Qualification* | *Year* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**WORK EXPERIENCE**

| *Organization* | *Period* | *Designation* | *Year* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**FINANCE**

How will you finance your professional studies at the institute?

Self ☐ Sponsored ☐

If sponsored, by whom?

........................................................... ...........................................................

Date Signature of the Sponsor

I hereby certify that the particulars furnished by me in this application are true & accurate and agree to abide by the rules and regulations governing the above course.

........................................................... ...........................................................

Date Signature of the Applicant

**Payments Procedure for the programmes**

Payments can be made to the credit of NIPM Current Account No. 3697566 maintain at any branch of Bank of Ceylon (BOC)and the printed "Customer Deposit Slip" should be forwarded to NIPM, Athurugiriya in order to obtain official receipt for payment.(Name to be written in bank deposit slip for identification of the payee)

06 - 268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.